# 2026 මාර්තු මාසයට අදාලව 2026.03.19 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

දිනය - 2026.03.19
වේලාව - පෙ.ව. 9.30
ස්ථානය - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| 01. වී. සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී. ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10. ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 15. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## (අ). පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2026.02.17 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2026.03.13 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තා මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් 2026.03.10 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවල සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් ගරු සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් 2026.02.17 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව හා 2026.03.10 දින පවත්වන ලද මාසික විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.02.17 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව හා 2026.03.10 දින පවත්වන ලද විශේෂ මාසික මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**(ආ).01. සභා ලේකම් මාසික මහ සභාවට සහභාගි නොවන බව දැන්වීම**

බිබිල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් ඩී.එම්. අනුෂා එස්. දිසානායක මියට අද දින නිවාඩු බැවින් ගරු සභාවට සහභාගි වීමට නොහැකි වීම පිළිබඳ ගරු මූලාසනය දන්වා ඇති බවත් සභා ලේකම්ගේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි එන්.එම්.දික්කුඹුර මියට පවරා ඇති බවත් ගරු සභාවට නිවේදනය කරන ලදී.

**(ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

**(ඈ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.**

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

**(ඉ).යථාපරිදි කල්දී ඇති යෝජනා.**

**(ඉ).01.ගරු මූලාසනයේ යෝජනා.**

**(ඉ).01.01. සිරිසඟබෝ මාවතේ යාර 400ට වැඩි වරිපනම් ඒකක කපා හැරීම සම්බන්ධවයි.**

2026.01.22 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී අංක 05.01.11 තීරණ අංකයට අනුව සිරිසඟබෝ මාවත වම වරිපනම් අංක 91 සිට 121 දක්වාත්, සිරිසඟබෝ මාවත දකුණ වරිපනම් අංක 78 සිට 116 දක්වා සහ සිරිසඟබෝ මාවත 1 පටුමඟ වම වරිපනම් අංක 5,15,23,29,31 සහ සිරිසඟබෝ මාවත 1 පටුමග දකුණ වරිපනම් අංක 6,12,20,24,28 දක්වා යාර 400 සීමාව ඉක්මවා තක්සේරු කර ඇති බැවින් එම බදුකරුවන්ගෙන් වරිපනම් බදු මුදල් අය නොකිරීමට තීරණය කර ඇත.

එසේම එම බදුකරුවන්ගේ 2025.12.31 දිනට හිඟ මුදල් පහත පරිදිවේ.

| අනු අංකය | වරිපනම් අංකය | නම | 2025.12.31 දිනට හිඟ මුදල |
|---|---|---|---|
| **සිරිසඟබෝ මාවත (වම)** | | | |
| 01 | 91 | අයිතිකරු(මනෝජ් ගුණරත්න මයා) | රු.1942.86 |
| 02 | 109 | අයිතිකරු | රු.7253.28 |
| 03 | 111 | ඩබ්ලිව්.එම්. සුදු මැණිකා මිය | රු.9446.44 |
| 04 | 121 | යූ.එච්.පියසේන මයා | රු.13602.27 |
| **සිරිසගඟබෝ මාවත (දකුණ)** | | | |
| 05 | 78 | ඩබ්. සමරවික්‍රම මයා | රු.5140.56 |

| | | | |
|---|---|---|---|
| 06 | 80 | අයිතිකරු | රු.1295.20 |
| 07 | 82 | අයිතිකරු | රු.8807.68 |
| 08 | 82/2 | අයිතිකරු | රු.7253.28 |
| 09 | 82/6 | අයිතිකරු | රු.7771.36 |
| 10 | 100 | අයිතිකරු | රු.6735.20 |
| 11 | 104 | අයිතිකරු | රු.5699.04 |
| 12 | 114 | අයිතිකරු | රු.19894.51 |
| 13 | 116 | අයිතිකරු | රු.585.30 |
| **සිරිසඟබෝ මාවත 1 පටුමග (වම)** | | | |
| 14 | 5 | එච්.එන් ආර්.නිමල්සිරි මයා | රු.9857.62 |
| 15 | 5/4 | එම්.කේ.සුනිල් අබේවික්‍රම මයා | රු.9655.17 |
| 16 | 15 | එච්.එන් ආර්.ගුණවතී මිය | රු.413.97 |
| 17 | 23 | යූ.එච්.ගාමිණී මයා | රු.8079.58 |
| 18 | 29 | තුෂාර මයා(කේ.එම්.නිලන්ත හේමසිරි මයා | රු.162.54 |
| 19 | 31 | අයිතිකරු(කේ.එම්.නිලන්තරත්න ප්‍රේමසිරි මයා | රු.8500.10 |
| **සිරිසගඟබෝ මාවත 1 පටුමග (දකුණ)** | | | |
| 20 | 6 | ඩී.ජී.විල්බට් මයා | රු.8069.64 |
| 21 | 12 | ඩී.ජී.විල්බට් මයා | රු.588.43 |
| 22 | 20 | ඒ.එන් ඒ. ප්‍රේමදාස මයා | රු.3909.65 |
| 23 | 24 | අයිතිකරු | රු.18058.76 |
| 24 | 28 | ආර්.එම්.විමලසේන මයා | රු.150.00 |
| | | **එකතුව** | **රු.162872.44** |

මෙම හිඟ මුදල කපා හැරීම සඳහා බිල්කළ මුදල ඉවත් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා**

සිරිසඟබෝ මාවතේ යාර 400 ඉක්මවා තක්සේරු කර ඇති බදුකරුවන්ගේ නාම ලේඛනයෙහි සමහර නම් " අයිතිකරු" ලෙස දක්වා ඇති බැවින් මෙම පුද්ගලයින් කවුරුන්දැයි නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වීම ගැටලුවක් බව පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**

සිරිසඟබෝ මාවතේ යාර 400 ඉක්මවා තක්සේරු කර ඇති බදුකරුවන්ගේ නාම ලේඛනයෙහි සමහර බදුකරුවන්ගේ 2025.12.31 දිනට හිඟ මුදල් රු.13602.27, 19894.51, 18058.76 ලෙස දක්වා ඇති බැවින් පෙනී යන්නේ සාමාන්‍ය වාර්ෂික වරිපනම් බද්ද රු.4000.00 ට පමණ අඩුවන බැවින් මෙම බදු කරුවන් වර්ෂ කිහිපයකම වරිපනම් බදු ගෙවා නොමැති බව යැයි පැවසීය. බිබිල ප්‍රාදේශීය සභාව මගින් වාර්ෂිකව වරිපනම් බදු අය කරන්නේ නම් " අයිතිකරු" ලෙස නොදැක්විය යුතු අතර මෙම බදුකරුවන්ගේ නාම ලේඛනයක් කාර්යාලය සතුව තිබිය යුතු බවත් පැවසීය. මෙම බදුකරුවන් යාර 400 න් එපිට සිටිනවාදැයි තහවුරු කරගෙන මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

මෙම නාම ලේඛනය දෙස බලන විට මෙම බදුකරුවන් බිබිල ප්‍රාදේශීය සභාවෙන් රාජ්‍ය පහසුකම් ලබන බවත් කෙසේ වුවද පනතට අනුව මේ බදුකරුවන් යාර 400ට වඩා වැඩි ප්‍රදේශයක නම් බදු කපා හැරීමට හෝ වරිපනම් සීමාව පුළුල් කර ගැනීමට තීරණයක් ගනිමු යැයිද පැවසීය. මෙම බදුකරුවන් හඳුනා ගැනීමට මෙහි " අයිතිකරු" ලෙස දක්වා ඇති අයගේ පුද්ගල නාම ඇතුළත් වියයුතු බවත් එවිට ඒ අය හඳුනා ගැනීමට හැකිවන බවත් නැවතත් මේ පිළිබඳ පරීක්ෂාවක් හා මැනීම් කටයුතු කර තීරණයක් ගැනීමට සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා**

මෙම බදුකරුවන් යාර 400 ඉක්මවා ඇති බව දක්වා ඇත්තේ නිශ්චිත අනුමැතියකින්ද , සභා තීරණයකින් ද යන්න අවබෝධ කරගතයුතු බවත් මෙය නීත්‍යාකූලව අය කර ගෙන ඇත්තේ ද බලහත් කාරයෙන් අයකළේ දැයි අවබෝධ කරගතයුතු බවත් නීත්‍යානුකූලව අයකර ඇත්නම්, මෙම 2025.12.31 දිනට හිඟ මුදල් අයකර ගැනීමෙන් පසු යාර 400 ඉක්මවයි නම් බදු කපා හැරීම සිදුකිරිමට තීරණය කිරීම සුදුසු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

සිරිසඟබෝ මාවතේ යාර 400 ඉක්මවා තක්සේරු කර ඇති වත්කම් හිමි බදුකරුවන්ගේ වත්කම් නිශ්චිතව යාර 400 ඉක්මවා පිහිටා තිබේ දැයි තහවුරු කරගෙන තීරණයක් ගැනීම සඳහා කල් තබන ලදී.

## (ඉ).01.02. නිශ්චිත පොදු ගබඩාවක් නොමැති වීම හේතුවෙන් මතුව ඇති ගැටළු සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ නිශ්චිත පොදු ගබඩාවක් නොමැති වීම නිසා ගැටළු රාශියකට මුහුණදීමට සිදුව තිබේ.එනම්,

අප ආයතනයේ දැනට ඉදිකර තිබෙන පොදු ගබඩාව තුළ භාණ්ඩ අසුරා තැබීමට තරම් ප්‍රමාණවත් ඉඩක් නොමැත. රාක්ක වල පිළිවෙලකට අසුරා තැබීමට සුදුසු භාණ්ඩ පවා (කැනපි හට් ) බිම ගොඩ ගසා ඇත.

තවද ආපදාවන්ට පත්වූ මහජනතාවට සේවය සැලසීමට ලැබී ඇති ආයුධ හා සුළු උපකරණ ද විශාල ප්‍රමාණයක් ආයතන පරිශ්‍රය තුල ඒ මේ අත අනාරක්ෂිතව ගොඩගසා ඇත.

කොඩි කණු නිකුත් කිරීමේ වගකීමද මුරකරුවන්ට භාරදීමට ලිපි සකස් කර අදාල කටයුතු සූදානම් කළද ඒවා අසුරා ඇති ආකාරයට දිනපතා ගණන් කර භාර ගැනීමට සිදුවන බැවින් ඒවා භාර ගැනීමට ඔවුන්ගේද මැලිකමක් ඇත. එම නිසා වගකීම් භාරදීමට පෙර විධිමත් ක්‍රමයකට (ගණනය කිරීමේ පහසුවක් ඇතිවන ලෙස ) අසුරා තැබීම අවශ්‍යව ඇත.

මෙම තත්වය මත පොදු ගබඩා විෂය භාර නිලධාරිණිය ඉතාමත් අසීරු තත්වයකට පත්ව සිටින අතර 2025 .12.31 දිනට නියමිත භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමේදීද ගැටළු රසකට මුහුණ පාන්නට සිදුවී ඇති බැවින් නව ගබඩාවක් ඉදිකිරීමටත් භාණ්ඩ හඳුනා ගැනීමේදී **බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බව තහවුරු කර** ගැනීමට හැකි වන පරිදි හා අස්ථානගතවීම වලක්වා ගැනීමට සෑම භාණ්ඩයකටම ඇතුලත් කිරීමට ලාංඡනයක් සකස් කිරීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.03. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පැනවූ දිනවල සහ රටේ පැවති තත්වය මත හිඟ බදු කුලී මුදල් ලේඛණ වලින් ඉවත් කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිම සම්බන්ධවයි .

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.06.24 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශිය සභාවේ මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.03 තීරණය අනුව කොරෝනා සමය තුල ඇඳිරි නිතිය ක්‍රියාත්මක වූ බැවින් කඩ කාමර වසා තිබු බව සියළු දෙනාට නොරහසක් නොවූවද නගරයේ කඩ හිමියන්ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන හා සනාථ කල හැකි ලියවිලි සපයාගෙන මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරිම සඳහා කල් තැබිමට තීරණය කර ඇත.

ඒ අනුව මගේ අංක BPS/03/09 හා 2025.08.29 දිනැති ලිපි මඟින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරික ස්ථාන වසා තැබුවා යැයි ලිපි ලබා දී ඇති කාලසිමාවන්ට අදාලව දිවුරුම් ප්‍රකාශ සහ සනාථ කල හැකි ලියවිලි සති දෙකක් ඇතුලත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.

නමුත් මේ වන තෙක් කඩකාමර බදුකරුවන් 6 දෙනෙක් පමණක් ලිඛිතව ඉල්ලිම් කර ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | කඩ කාමර පිහිටි ස්ථානය | කඩ කාමර අංකය | බදු කරුගේ නම | විස්තරය |
|---|---|---|---|---|
| 01 | බිබිල නව වෙළඳ සංකීර්ණය | 16 | එස්.රණදේව | දිවුරුම් ප්‍රකාශයක් සහිතව ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇත. |
| 02. | බහුකාර්ය ගොඩනැගිල්ල | 07 | එච්.එම්.මුතුමැණිකා | දිවුරුම් ප්‍රකාශයක් සහිතව ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇත. |
| 03 | එළවළු කඩ කාමර | 09 | ඒ.ඩබ්.එම්.වීරසූරිය | ස්වාමිපුරුෂයාට අයත්ව තිබූ කඩ කාමරය බවත්,බදු කුලී අය කර නොගන්නා ලෙස ඒ.එම්.චන්ද්‍රාවති මිය විසින් දිවුරුම් ප්‍රකාශ සහිතව ඉල්ලීමක් කර ඇත. |
| 04. | එළවළු කඩ කාමර | 16 | ඒ.එම්.ඇග්නස් පෙරේරා | දිවුරුම් ප්‍රකාශ රහිතව ඉල්ලීමක් කර ඇත. |
| 05 | එළවළු කඩ කාමර | 17 | ඒ.එම්.ඇග්නස් පෙරේරා | දිවුරුම් ප්‍රකාශ රහිතව ඉල්ලීමක් කර ඇත. |
| 06 | පොදු වෙළඳපොල | A -14 | ඩබ්.ඒ.කේ.හේමචන්ද්‍ර | දිවුරුම් ප්‍රකාශ රහිතව ඉල්ලීමක් කර ඇත. |

ඒ අනුව 2021 වර්ෂයට අදාලව කොවිඩ් 19 හේතුවෙන් 2021 ජූනි, අගෝස්තු හා සැප්තැම්බර් මාසවල කුලී මුදල් අඩු කිරිම පිළිබඳ විස්තර මේ සමඟ ඉදිරිපත් කරන අතර මේ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා සුදුසු තීරණයක් ගැනිමට ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

පසුගිය සභාවාරයන් වලද දිගින් දිගටම සාකච්ඡාවට භාජනය වූ යෝජනාවක් බවත් මෙම කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇදිරි නීතිය පනවා ඇති සමයෙහි ව්‍යාපාරික ස්ථාන වසා තබා මෙම ප්‍රශ්නයට මුහුණදී ඇත්තේ මෙම බදුකරුවන් 6 දෙනා පමණක් වන්නට ඇතැයිද අනෙකුත් බදුකරුවන් මුහුණදී නැතිව ඇතැයි සිතන බව පැවසීය. මෙම බදු මුදල් කපා හැරීමට සභාවක් ලෙස මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් තිරණයක් ගතහොත් අධිහාර වීමට ඉඩ ඇති බැවින් ගරු ආණ්ඩුකාරතුමා මගින් ගරු අමාත්‍යතුමා වෙත යොමුකර අනුමැතියක් ලැබුණහොත් ඒ අනුව කපා හැරීම් කටයුතු සිදු කිරිම සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බිබිල ප්‍රාදේශිය සභාවට බදු ගෙවනු ලබන බදුකරුවන් සියලු දෙනාට මෙම අර්බුදයට මුහුණ පා ඇති බවත් එබැවින් එම සියළු දෙනාගේ ම එම කාලසීමාව තුළ කුලී මුදල අඩු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා මගින් පළාත් පාලන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන කොවිඩ් 19 සමයෙහි කපා හැරීමට ඇති සියළු බදුකරුවන්ගේ කුලී මුදල් කපා හැරීමට කටයුතු කිරීම සුදුසු බව පැවසීය. නැතහොත් මෙම ඉදිරිපත් කර ඇති බදුකරුවන් 6 දෙනාගේ පමණක් කුලී මුදල් කපා හැරීමට තීරණය වුවහොත් දිගින් දිගටම කුලී මුදල් කපා හැරීමට බදුකරුවන් ඉදිරිපත් කිරීමට ඉඩ ඇති බවද පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පැනවූ දිනවල සහ රටේ පැවති තත්වය මත බිබිල ප්‍රාදේශිය සභාවට හිමි කඩ කාමර වල ව්‍යාපාර කටයුතු සිදු කරනු ලැබූ බදුකරුවන්ගේ හිඟ බදුකුලී මුදල් ලේඛන වලින් ඉවත් කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිසතුමා මගින් පළාත් පාලන කොමසාරිස්තුමා මගින් අමාත්‍යංශ ලේකම්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන හිඟ කුලී මුදල් ලේඛන වලින් ඉවත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.
අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.04. මාසික කුලිය පදනම මත ලබා ගත් ජෙනරේටරය වෙනුවෙන් මුදල් ගෙවීම.

රදලියද්ද ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරිමේදි විදුලි බලය අඩු නිසා මාසික කුලිය පදනම මත 2025.10.12 වන දින සිට දිනකට රු.1000.00 මුදලක් ගෙවීමට ප්‍රසම්පාදනය කර නිම්සර ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයෙන් ලබා ගන්නා ලදි. 2025 වර්ෂයේ දින 80කට මුදල් ගෙවා ඇත.

2026.03.07 දින නව ජෙනරේටරය ආදාහනාගාරයේ ස්ථාපිත කළ අතර නිම්සර ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයට 2026.01.01 දින 2026.03.06 දින දක්වා දින 65ක් සඳහා රු.65000.00ක් ගෙවීමට තිබෙන බැවින් එම මුදල ගෙවීම් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.05. ප්‍රසම්පාදන කමිටුව සංශෝධනය කර පත් කිරීම.

2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව පහත ලෙස අනුමත වී ඇති නමුත් විගණකාධිපතිගේ අංක UPLG/MG/A/BBLPS/2025/AQ/30 හා 2026.02.20 දිනැති මූල්‍ය හා කාර්යසාධනය - 2025 අනුව ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු බව විගණනයෙන් පෙන්වා දී ඇත. තවද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන )රීති වල 178 වගන්තිය අනුව ටෙන්ඩර් මණ්ඩලය සභාපතිවරයාගෙන් හා අඩු වශයෙන් එක් එක් වර්ෂය සඳහා සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් වත් සමන්විත විය යුතු බව සඳහන්ව ඇත.

ඒ අනුව මෙම ප්‍රසම්පාදන කමිටුව ගරු සභාපති ඇතුළුව තවත් සාමාජිකයින් දෙදෙනෙකු වශයෙන් සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අ.අ. | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මැතිතුමා | ගරු සභාපති | සභාපති |
| 02 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 03 | ඩබ්.එම්.රූපසේන මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 04 | ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 05 | ඩී.ඒ.නිශාන්ත අමරතුංග මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |

<u>ප්‍රසම්පාදන කමිටුවේ කාර්යභාරය</u>

- මුදල් හා ප්‍රතිපාදන ඇති බව තහවුරු කර ගැනීම
- ප්‍රසම්පාදන ක්‍රමය, ලංසු ආරාධනා කරන දිනය, ලංසු විවෘත කිරීමේ දිනය තීරණය කිරීම
- ලංසු ලේඛන සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු හා එකඟ වීම
- තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පැහැදිලි කිරීම් ලබා ගැනීම
- තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා වාර්තා ඇගයීම
- ලංසුකරුවන් සමඟ සාකච්ඡා කිරීම
- ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීම

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ දැනට සිටින ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගෙන් සංශෝධිත නව ප්‍රසම්පාදන කමිටුව සඳහා,

| අ.අ. | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මැතිතුමා | ගරු සභාපති | සභාපති |
| 02 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 03 | ඩබ්.එම්.රූපසේන මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |

සුදුසු බව යෝජනා කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ද සංවර්ධන කමිටු සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද පත්කර ඇති බවත් , බිබිල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ මන්ත්‍රීවරු 08ක් නියෝජනය කරන බවත් මෙම ප්‍රසම්පාදන කමිටුව සඳහා විපක්ෂ මන්ත්‍රීවරයෙකුද පත් කිරීමට සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා**

ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමාගේ අදහසට ගරු කරන බවත් මේ පිළිබඳව දැනුමක් අවබෝධයක් ඇති මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ලෙස ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා හා ඩබ්.එම්.රූපසේන මැතිතුමා පත් කළ බවත් වෙනත් මන්ත්‍රීවරයෙකු පත් කිරීම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බවත් පැවසීය.

**ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය**

විපක්ෂය නියෝජනය කරමින් ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා ප්‍රසම්පාදන කමිටුවට පත් කිරීමට සුදුසු බව යෝජනා කරන ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

ප්‍රසම්පාදන කමිටුවෙන් ස්ව කැමැත්තෙන් කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බවත් තමා වෙනුවට ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම් අසංක වාසළ මැතිතුමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ සංශෝධිත ප්‍රසම්පාදන කමිටුව ලෙස,

| අ.අ. | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මැතිතුමා | ගරු සභාපති | සභාපති |
| 02 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 03 | ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | ගරු මන්ත්‍රී | සාමාජික |

සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.06. 2026.03.10 දින සිට ලංසු විවෘත කිරීමේ කමිටුව සංශෝධනය කිරීම

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට ලබා ගන්නා භාණ්ඩ, වැඩ හා සේවා සඳහා මිල ගණන් කැඳවීමේදී ලංසු විවෘත කිරීමේ කමිටුව වශයෙන් පහත නිලධාරීන් පත් කර තිබුණි.

| අ.අ | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | ඩී.එම්.අනූෂා එස්. දිසානායක මිය | සභා ලේකම් | සභාපති |
| 02 | කේ.ඕ.එච්.බී.තිලකරත්න මයා | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි | සාමාජික |
| 03 | ටී.ආර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මිය | කාර්මික නිලධාරි | සාමාජික |

නමුත් ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි තුමා වශයෙන් කටයුතු කළ කේ.ඕ.එච්.බී.තිලකරත්න මහතා ස්ථාන මාරුවීම හේතුවෙන් ලංසු විවෘත කිරීමේ කමිටුව 2026.03.10 දින සිට පහත ලෙස සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අ.අ | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | ඩී.එම්.අනූෂා එස්. දිසානායක මිය | සභා ලේකම් | සභාපති |
| 02 | එන්.එම්.දික්කුඹුර මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි | සාමාජික |
| 03 | ටී.ආර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මිය | කාර්මික නිලධාරි | සාමාජික |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.07. ගිණුම් අංක 011100100000403 දරණ ජංගම ගිණුමේ දෙවන අත්සන තැබීමේ බලය ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ දෙවන අත්සන තැබීමේ බලය හිමිවූ ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි කේ.ඕ.එච්.බී.තිලකරත්න මයා (710493740V) ස්ථාන මාරු ලබා ඇති බැවින් 2026.03.05 දින සිට චෙක්පත් නිකුත් කිරීමට දෙවන අත්සන තැබීමේ බලය නව ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි එන්.එම්.දික්කුඹුර මියට පැවරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

පෙ.ව.10.15 ට ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

## (ඉ).01.08. ස්මාර්ට් ජංගම දුරකතනයක් මිලදී ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ පෙර ගරු සභාපතිතුමා විසින් භාවිතා කරන ලදුව සහා ලේකම් තුමිය වෙත නිකුත් කර තිබූ ස්මාර්ට් ජංගම දුරකථනය (Huawei) අක්‍රිය වී ඇති බැවින් 2026.03.04 දිනැතිව පොදු ගබඩාවට භාරදී ඇත. මේ වන විට ස්මාර්ට් ජංගම දුරකථනය අලුත්වැඩියා කරගත නොහැකි ලෙස අක්‍රීය වී ඇති බැවින් ගරු සභාපතිතුමාට ලබාදීමට ස්මාර්ට් ජංගම දුරකථනයක් මිලදී ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## (ඉ).01.09. 20KVA ජෙනරේටරය වාර්ෂිකව සේවා කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ සවිකර තිබෙන 20KVA ජෙනරේටරයේ වාර්ෂික සේවා කටයුතු සිදු කරන Browns ආයතනය (2026.03.01 සිට 2027.03.01 දක්වා) මෙවර සේවා කටයුතු සිදු කිරීම සඳහා රු.153400.00ක සේවා ගාස්තු සිදුකළ යුතු බව 2026.02.12 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. එබැවින් එම මුදල ගෙවීම් කර වාර්ෂික සේවා කටයුතු සිදුකිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

මෙම ජෙනරේටරය වර්ෂයක කාලයක් තුළ වාර සේවා කටයුතු සිදු කිරීමට වඩා මෙය භාවිතා කළ පැය ගණන පිළිබඳ කාර්මික නිළධාරි මහතාගෙන් වාර්තාවක් ලබා ගෙන ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගෙන 20 KVAජෙනරේටරය වාර්ෂික සේවා කිරීම පිළිබඳව තීරණයක් ගැනීමට යෝජනාව කල් තබන ලදී.

## **(ඉ).01.10. බිබිල රදලියද්ද ආදාහනාගාරයේ වාර සේවාව සිදු කිරීම.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරය ඉදි කිරීමෙන් අනතුරුව දැනට මෘත දේහ 110ක් ආදාහනය කර ඇත. මෘත දේහ 100ක් දැවීමෙන් අනතුරුව වාර සේවාව සිදුකළ යුතු බව හා දැනට එම සේවාව රදලියද්ද ආදාහනාගාරයේ සිදු කළ යුතු බව දන්වා ඇති අතර දැනට එම සීමාව ඉක්මවා ගොස් ද ඇත.

මෙම වාර සේවාව සිදුකර ගැනීම සඳහා කාර්මික සේවා පිළිබඳ කාරක සභා කමිටුවේ නිර්දේශ මත කඩිනමින් වාර සේවාව සිදුකළ යුතු බව BPS/4/5 කර්මාන්ත අංක හා 2026.02.23 දිනැති ලිපියෙන් සභා අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව 2026.02.23 දිනැති ලිපියට අනුව මෙම යන්ත්‍රය ස්ථාපනය කළ එම්.එන්.ජී.කන්ට්‍රක්ෂන් පුද්ගලික සමාගමේ ඉංජිනේරු වාර සේවාව සිදු කිරීමට අදාළව රු.237,180.00ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බැවින් එම මුදල ගෙවීම් කර වාර සේවාව සිදු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

ආදාහනාගාරයේ මෘත දේහ 100ක් ආදාහනය කළ පසු වාර සේවාව නිසි පරිදි සිදුකළ යුතු වුවත් බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන රදලියද්ද ආදාහනාගාරයේ අද දින වන විට මෘතදේහ110ක් නොව 120ක් පමණ ආදාහන කටයුතු සිදුකර ඇති බැවින් , මේ වනවිට දිනකට එක් මෘත දේහයක් පමණක් ආදාහනය කිරීමට තීරණය කර ඇති බව පැවසීය.

මෙම යන්ත්‍රය ස්ථාපනය කළ M.N.G. කන්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම විසින් ඉන්ජිනේරු වාර සේවාව සිදු කිරීමට රු.237,180.00ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බැවින් එක් මෘත දේහයක් වෙනුවෙන් වාර සේවාවට රු.2000.00 ක පමණ මුදලක් වැය වන බවත් , ලංකාව පුරාම මෙම යන්ත්‍ර ස්ථාපනය කරන ආයතන සීමිත බැවින් වෙනත් ආයතනයකින් අලුත්වැඩියාව සිදුකලද මෙතරම් මුදලක් වැය වනු ඇතැයිද පැවසීය.

මෙම ආයතනය විසින් නොමිලේ වාර සේවාව, ස්ථාපිත කර අවුරුද්දක් ඇතුළත සිදුකළද මෙය ස්ථාපිත කර දිගු කාලයක් බැවින් එම අවස්ථාව බිබිල ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට නොහැකි බැවින් මුදල් ගෙවීම් කර වාර සේවාව සිදුකර ගැනීමට සිදුවන බව පැවසීය. මෙම කටයුතු සිදු කිරීමේදී ඒ සඳහා සවිකිරීම් උපාංග මිලදී ගැනීමට සිදුවුව හොත් ඒවා මිලදී ගැනීමටද මුදල් වැයවන බවද තව දුරටත් පැවසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා

මේ වනවිට මැදගම ආදාහනාගාරයද අක්‍රීය තත්වයට පත්ව ඇති බවත් එබැවින් බිබිලට පමණක් නොව විශාල ප්‍රදේශයක ජනතාවකට මෙම රදලියද්ද ආදාහනාගාරය වැදගත් වන බවත් බිබිල ප්‍රදේශයේ ජනතාවට රදලියද්ද ආදාහනාගාරය සම්පතක් බවත් පැවසීය. බිබිලේ ජනතාවට විශාල සේවාවක් මෙම ආදාහනාගාරයෙන් සිදුවන බැවින් හා බිබිල ප්‍රාදේශීය සභාව සමාජ සුභ සාධනය ප්‍රමුඛ කරගෙන කටයුතු කරන නිසා වාර සේවාවට වැය වන මුදල පිළිබඳව නොසලකා හැකි ඉක්මණින් වාර සේවාව සිදු කිරීමට සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

ප්‍රාදේශීය සභාව ජනතාවට සේවාවක් සපයන ආයතනයක් වුවද විශාල මුදලක් වැයකර ඉදිකර ඇති බැවින් මෙමගින් ආදායම් උත්පාදනය කළයුතු බව පැවසීය. මෙමගින් වාර්ෂික ආදායම රු.137500.00ක් පමණ වන අතර මෙම ජෙනරේටරය සවි කිරීමට රු.173000.00 ක පමණ මුදලක් හා වාර සේවාවට රු.237000.00 ක පමණ මුදලක් බැගින් රු.500000.00 වියදමක් හා විදුලිය ,ගෑස් ,සේවක වැටුප් ගෙවීම වැනි වියදම් අනුව අවුරුද්දකට රු.1000000.00ක පමණ මුදලක් වැය වන බැවින් ආදාහනාගාරයෙන් එතරම් මුදලක් ආදායමක් උත්පාදනය නොවන බව පැවසූ අතර එබැවින් ජනතාවගේ ගාස්තු වැඩි නොකර වෙනත් වියදම් හා මෙහෙයුම් වියදම් පාලනය කර ආදායම් උත්පාදනය වැඩි කර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.11.වියදම් දැරීමේ සීමාව සඳහා බලයදීම.

බිබිල ප්‍රාදේශීය සභාවේ එදිනෙදා කටයුතු සඳහා වියදම් දැරීමේදී අනුමැතිය ලබාගෙන, ගෙවීම් කිරීමේ බලය පහත සඳහන් පරිදි ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- රු.100,000.00 දක්වා ගරු සභාපතිවරයාට
- රු.100001.00 සිට රු. 500,000.00 දක්වා මිල කමිටුවට
- රු.500,001.00 ට වැඩි වියදම් මහ සභාවට

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.12. සුනඛ කරපටියක අලෙවි කරන මිල සංශෝධනය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ සුනඛ කරපටි අලෙවි මිල රු.30.00 ක් වන අතර මේවන විට වෙළඳපල භාණ්ඩ මිල ඉහළ අගයක් ගන්නා බැවින් 2026 වර්ෂයේ සිට සුනඛ කරපටියක් රු.100.00 බැගින් අලෙවි කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.13. වරිපනම් බදු වලින් නිදහස් කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති අඩු ආදායම් ලාභීන් 2026 වර්ෂයට වරිපනම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ වරිපනම් බදු පැනවීම සඳහා දියුණු ගම් ප්‍රදේශයක් ලෙස 1990.11.30 දින අංක 639 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ iv (අ) දරණ ගැසට් පත්‍රයේ මගින් ප්‍රකාශයට පත් කර ඇත.එම ගැසට් පත්‍රයේ,

- බිබිල මඩකලපුව පාරේ අඹගොල්ල හංදිය දක්වා,
- බිබිල මහියංගන පාරේ 1 කණුව දක්වා,
- බිබිල ගල්ගේලන්ද පාරේ ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා,
- බිබිල බදුල්ල පාරේ යල්කුඹුර ප්‍රධාන ජල ගබඩා ටැංකිය දක්වා සහ කඩඉම් කඳුර අසල දක්වා,
- බිබිල මොණරාගල පාරේ ගල්ඔය දක්වා,
- බිබිල පිටකුඹුර පාරේ හබ්බුන්නා කඳුර අසල දක්වා මාර්ග වල මාර්ගය දෙපසට යාර 400ක ප්‍රදේශයක ඇතුළත්ව පිහිටි දේපළ වලින් වරිපනම් බදු අය කිරීම සඳහා නිවේදනය කර ඇත.

මෙම සීමාව තුළ පදිංචිව සිටින බදුකරුවන් දහඅට දෙනෙකු විසින් වරිපනම් බදු වලින් නිදහස් කර දෙන ලෙසට ඉල්ලීම් කර තිබුණි. එම බදු කරුවන්ගෙන් දාහත් දෙනෙකු අඩු ආදායම් ලාභීන් බවට එක් බදු කරුවෙකු අසනීප තත්වයෙන් පසු වන බවටත් ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර ඇත.මේ පිළිබඳව සභාවේ ආදායම් පරීක්ෂක මහතා පරීක්ෂා කොට 2026 වර්ෂයට වරිපනම් බදු වලින් නිදහස් කිරීම සුදුසු බවට වාර්ථා කර ඇත.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව මෙම බදුකරුවන් දහඅට දෙනාගේ දරිද්‍රතාවය හා එක් අයෙකුගේ අසනීප තත්වය හේතු කොට ගෙන රු. 48265.50ක බදු මුදල 2026 වර්ෂයේ වරිපනම් බදු මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම සුදුසු බවට ආදායම් පරීක්ෂක මහතා විසින් වාර්තා කළ තොරතුරු ඇතුළත් උප ලේඛනය මේ සමඟ ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම බදුකරුවන්ගේ වරිපනම් බදු මුදල් 2026 වර්ෂය සඳහා නිදහස් කිරීම සුදුසු බව මෙම ගරු සභායට යෝජනා කරමි.

| අනු අංකය | වරිපනම් බදු අංකය | පාර | ඉල්ලුම්කරුගේ නම | වරිපනම් බදු ලේඛනයේ සදහන් නම | වාර්ෂික බදු මුදල රු. |
|---|---|---|---|---|---|
| 1 | 339 | බදුල්ල පාර | එස්.එම්.චන්ද්‍රාවතී මිය | බී.පී.මාලනී රම්‍යලතා ද සිල්වා(එස්.එම්.චන්ද්‍රාවතී) මිය | 1813.28 |
| 2 | 540 | බදුල්ල පාර | එල්.එස්.එච්.නෙල්සන් මයා | එල්.එස්.එච්.නෙල්සන් මයා | 2493.28 |
| 3 | 542 | බදුල්ල පාර | එච්.බී.වනසිංහ මයා | බී.විමලාවතී මිය | 1284.48 |
| 4 | 717 | බදුල්ල පාර | ඒ.එම්. විජේරත්න මයා | ඒ.එම්.උක්කුබංඩා (ඒ.එම්. විජේරත්න මයා) | 1133.28 |
| 5 | 723 | බදුල්ල පාර | ඒ.එම්. විජේරත්න මයා | ඒ.එම්. විජේරත්න මයා | 2153.28 |
| 6 | 795/19 | බදුල්ල පාර | ටී.එම්.කරුණාදාස මයා | ටී.එම්.කරුණාදාස මයා | 982.24 |
| 7 | 860 | බදුල්ල පාර | ආර්.එච්.එම්.අශෝක අලවතුගොඩ මයා | අආනන්ද අලවතුගොඩ මයා | 2568.96 |
| 8 | 36 | මොණරාගල පාර ixxx පටුමග | ඩී.එම්.චන්ද්‍රලතා දිසානායක මිය | ඩී.එම්.කරුණාසුන්දර මයා | 1804.20 |
| 9 | 46 | මොණරාගල පාර | ඩී.එම්.මුතුබංඩා මයා | ඩී.එම්.මුතුබංඩා මයා | 3060.00 |
| 10 | 394 | මොණරාගල පාර | ඒ.එම්. සෝමාවතී මිය | ඒ.එම්. සෝමාවතී මිය | 3074.16 |
| 11 | 23 | මඩකලපුව පාර iiපටමග | එස්.එම්. චන්ද්‍රාවතී මිය | අයිතිකරු(එස්.එම්. ගාමිණී රාජපක්ෂ) මයා | 2590.50 |
| 12 | 286 | මඩකලපුව පාර | ඊ.එම්.පියතිලක මයා | ඊ.එම්.පියතිලක මයා | 3777.76 |
| 13 | 300 | මඩකලපුව පාර | ජයකොඩිගේ ආරියපාල මයා | ජයකොඩිගේ ආරියපාල මයා | 3274.08 |
| 14 | 145/17 | මහියංගන පාර | එස්.තමිල් අරසි | ප්‍රින්ස්ලි ඉදිගහවෙල (එස්.තමිල් අරසි) | 3525.92 |
| 15 | 208/17 | මහියංගන පාර | වයි.එම්.රෝහිණී මල්කාන්ති මිය | වයි.එම්.රෝහිණී මල්කාන්ති මිය | 2518.48 |
| 16 | 208/16 | මහියංගන පාර | වයි.එම්.ධර්මරත්න මයා | වයි.එම්.ධර්මරත්න මයා | 4821.52 |
| 17 | 215/64 | මහියංගන පාර | එම්.වී.රත්නසීලි මිය | ප්‍රින්ස්ලි ඉදිගහවෙල (කේ.ඒ.ශාමෙල් මයා) | 4281.52 |
| 18 | 26 | රතුපස්කැටිය පාර | කේ.ඒ.ගුණපාල මයා | කේ.ඒ.ගුණපාල මයා | 3108.56 |
| එකතුව | | | | | 48265.50 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නාමල් බණ්ඩාර මැතිතුමා**

වරිපනම් බදු නිදහස් කිරීම සඳහා මෙම ඉදිරිපත් කර ඇති නාම ලේඛනය දෙස බලන විට ඇතැම් පුද්ගලයින්ගෙන් අඩු ආදායම්ලාභීන් නොවන බවත් ඒ අයගේ බදු මුදල් කපා හැරීම නුසුදුසු බවත් පැවසීය. මේ අයගේ බදු මුදල් නිදහස් කිරීමට පෙර දරිද්‍රතාවයෙන් පෙළෙන්නේද යන්න පිළිබඳව අවබෝධ කර ගෙන තීරණයක් ගතයුතු බව හා ග්‍රාම නිලධාරි , සමෘද්ධි නියාමක යන නිලධාරීන්ට පවරා තොරතුරු ලබා ගෙන 2026 වර්ෂයෙහි වරිපනම් බදු කපා හැරීමේදී එහි වගකීම බිබිල ප්‍රාදේශීය සභාව භාර ගතයුතු බව පැවසීය.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

වරිපනම් බදු ලේඛනයේ නම් සඳහන් බදු ගෙවන්නන් දරිද්‍රතාවයෙන් පෙළෙන බවට ග්‍රාම නිලධාරි නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්තුමා සහතික කර ප්‍රාදේශීය සභාව වෙත එවා ඇති අයදුම්පත් ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂා කර බලා දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින් ලෙස හඳුනාගෙන ඉදිරිපත් කර ඇති බවත් පනතේ බලතල අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ වරිපනම් කපා හැරිය හැකි බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙන ලදී. මෙම වරිපනම් ගෙවන්නන් පිළිබඳ තොරතුරු සොයා බැලීමට මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත කමිටුවක් පත්කර සත්‍යතාවය අවබෝධ කර ගැනීමට හෝ මෙය නැවතත් කාර්ය මණ්ඩලයට පවරනු ලබන්නේදැයි ගරු සභාවෙන් විමසා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා**

බිබිල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා , කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා හා ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමාගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටුව මගින් මෙම වරිපනම් බදුකරුවන් දරිද්‍රතාවයෙන් පෙළෙන්නේ දැයි නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා**

මෙම ජනතාවගේ දරිද්‍රතාවය පිළිබඳ සොයා බැලීම සඳහා ජනතා පරමාධිපත්‍යයෙන් පත්වී ඇති මන්ත්‍රී මණ්ඩලය මැදිහත් නොවී නිලධාරි මණ්ඩලයෙන් යුත්ත කමිටුවක් පත් කර තොරතුරු සොයා බැලීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා**

මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත කමිටුවක් පත් නොකර නිලධාරි මණ්ඩලයෙන් සමන්විත කමිටුවක් මගින් තොරතුරු රැස්කිරීමට සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

මෙම පුද්ගලයින්ගේ දරිද්‍රතාවය සනාථ කගෙන ඇත්තේ ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් බවත් මේ අය ග්‍රාම නිලධාරිවරයාගෙන් ඉල්ලීමක් කර නිර්දේශ කරගෙන පැමිණියද මෙම නාම ලේඛනය දෙස බලන විට මේ අය අතර දරිද්‍රතාවයෙන් නොපෙළෙන පුද්ගලයින් සිටින බවත් එබැවින් මේ පිළිබඳ තීරණයක් ගැනීමට පෙර මෙම පුද්ගලයින් පිළිබඳ විශ්ලේෂණය කර තොරතුරු සොයා බැලීය යුතු බව පැවසීය.

**ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා**

ආදායම් පරීක්ෂක මහතා විසින් මෙම පුද්ගලයින් විසින් ඉදිරිපත් කර ඇති ලිපි ගොනු පරීක්ෂා කර බලා සනාථ කර වාර්තා කළ තොරතුරු අනුව මෙම නාම ලේඛනය ඉදිරිපත් කර ඇති බවත් නැවතත් පරීක්ෂාවක් කිරීමට මෙම නම් හිමි පුද්ගලයින් පිළිබඳ මන්ත්‍රී මණ්ඩලයද බාහිරින් සිට සොයා බැලීමක් කළයුතු බවද පැවසීය.

__ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා__

2026 වර්ෂයට වරිපනම් බදු නිදහස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති නාම ලේඛනය ආදායම් පරීක්ෂක මහතා සනාථ කර ඇත. නමුත් මෙම නම් දෙස බලන විට එම පුද්ගලයින් ඉතා පොහොසත් පුද්ගලයින් බැවින් වරිපනම් බදු වලින් නිදහස් නොකළ යුතු බවත් එබැවින් ප්‍රාදේශීය සභාවෙන් කාර්මික නිළධාරි, වගකිවයුතු තවත් නිලධාරියෙක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ග්‍රාම නිලධාරි ඇතුළු කමිටුවක් මගින් විමර්ෂණයක් කර දරිද්‍රතාවයෙන් පෙලෙන්නේ දැයි නීත්‍යානුකූල වාර්තාවක් ලබා ගතයුතු බව පැවසීය. දරිද්‍රතාවයෙන් පෙළෙන අසනීප තත්වයෙන් පෙළෙන හෝ ආබාධිත පුද්ගලයින් ගෙන් නම් 2026 වර්ෂය සඳහා වරිපනම් බදු කපාහැරීම සුදුසු බවත් මෙහි සඳහන් සමහර පුද්ගලයින් සුපිරි පන්තියේ පුද්ගලයින් බවද පැවසීය.

__ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය.__

නාමිකව මෙම පුද්ගලයින් මන්ත්‍රී මණ්ඩලය නොහඳුනන බවත් එබැවින් මේ අයගේ දරිද්‍රතාවය පිළිබඳව ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි මගින් වාර්තාවක් ලබා ගතයුතු බවත් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලය මැදිහත් නොවිය යුතු බවත් පැවසීය.

__ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා__

ග්‍රාම නිළධාරිවරුන්ගෙන් සහතිකයක් අත්සන් කිරීමට ගියවිට ඒවා සියළු දෙනාටම අත්සන් කර ලබා දෙන බවත් එබැවින් නිරවද්‍ය තොරතුරක් එම නිළධාරීන්ගෙන් ලබා ගැනීමට නොහැකිවනු ඇතැයි බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටම මෙය නොපවරා බිබිල ප්‍රාදේශීය සභාවද මේ සඳහා සම්බන්ධ වියයුතු බව පැවසීය.

__ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා__

මන්ත්‍රී මණ්ඩලය මෙන් නොව රාජ්‍ය නිලධාරීන් වගකීමක් සහිත නිලධාරීන් බවත් එබැවින් ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කර ග්‍රාම නිලධාරි මගින් මෙම නාම ලේඛනයේ ඇතුළත් පුද්ගලයින්ගේ දරිද්‍රතාවය පිළිබඳ නිවැරදි වාර්තාවක් ලබා ගතයුතු බව පැවසීය. මෙම නියෝජිතයින් පත්ව ඇත්තේ පෙර තිබූ ආකාරයටම රට පවත්වාගෙන යාමට නොවන බවත් එබැවින් ඒවා නිවැරදි කළයුතු බවත් එබැවින් අනිවාර්යයෙන්ම කොතරම් කාලයක් වැය වුවත් ග්‍රාම නිලධාරි වෙත මෙම වගකීම පැවරිය යුතු බවත් ඒ අයගෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කළයුතු බවත් එසේ නොකරන්නේ නම් එම නිලධාරීන්ගේ වැරදි නිවැරදි කිරීමට මැදිහත් වියයුතු බවත් පැවසීය.

__ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය.__

බිබිල ප්‍රාදේශීය සභාවට ජල බිලක් අඩුකර ගැනීමට පුද්ගලකු පැමිණි බවත් එම පුද්ගලයා පිළිබඳව මන්ත්‍රීවරියක් ලෙස නොව සාමාන්‍ය පුද්ගලයෙකු ලෙස ඒ අය පිළිබඳව සොයා බැලූවිට එම නිවසෙහි අම්මා හා පුතා මානසික රෝගයකින් පෙලෙන බවත් පියා ආබාධිත බවත් පැවසීය. එසේම ඉතා පොහොසත් පුද්ගලයින්ගේ දරුවන්ට වංචාවෙන් මහපොළ ශිෂ්‍යත්ව ලබා ගෙන ඇති බවත් පැවසීය. ඒ අනුව බලන විට මෙම 2026 වර්ෂයට වරිපනම් බදු කපා හැරීමට ඉදිරිපත් කර ඇති නාම ලේඛනයේ පුද්ගලයින් පිළිබඳව ප්‍රායෝගිකව සොයා බලා යථාර්තය අවබෝධ කර ගැනීමට මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා මැදිහත් වියයුතු බව පැවසීය.

__ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා__

ග්‍රාම නිළධාරි , සමෘද්ධි නියාමක වැනි නිළධාරීන්ට වඩා මෙම නාම ලේඛනයේ නම් සඳහන් පුද්ගලයින්ගේ දරිද්‍රතාවය පිළිබඳ තොරතුරු රැස් කිරීමෙහි වගකීම බිබිල ප්‍රාදේශීය සභාව භාර ගතයුතු බව පැවසීය.

**ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා**

දරිද්‍රතාවයෙන් පෙළෙන නිසා වරිපනම් බදු කපා හැරීමට ඉදිරිපත් කර ඇති නාම ලේඛනය බිබිල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර මෙම පුද්ගලයින්ගේ දරිද්‍රතාවය පිළිබඳව නිවැරදි තොරතුරු ග්‍රාම නිලධාරි මගින් රැස් කර බිබිල ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා යැවීමට කටයුතු කර ගරු මන්ත්‍රී මණ්ඩලය බාහිරින් සිට මේ පිළිබඳව අධයනය කිරීමට සුදුසු බව පැවසූ අතර මෙම පුද්ගලයින් පිළිබඳව ආදායම් පරීක්ෂක මහතා දරිද්‍රතාවයෙන් පෙළෙන බව තහවුරු කිරීමට උපයෝගී කරගත් තොරතුරු සමගින් නැවත මහ සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේ නම් සුදුසු බව පැවසීය.

ගරු මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

වරිපනම් බදු නිදහස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති අඩු ආදායම් ලාභීන් 2026 වර්ෂයට වරිපනම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති නාම ලේඛනයෙහි ඇතුළත් පුද්ගලයින්ගේ දරිද්‍රතාවය පිළිබඳව නිවැරදි තොරතුරු ලබා දෙන ලෙස බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපියක් ඉදිරිපත් කිරීමටත් , ආදායම් පරීක්ෂක මහතා මෙම නාම ලේඛනයේ සඳහන් පුද්ගලයින් දරිද්‍රතාවයෙන් පෙළෙන බැවින් බදු කපා හරින ලෙස සනාථ කළ ලියවිලි සමඟ ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **(ඉ).01.14. අභියානාධිකරණ නඩු සදහා නීතීඥ ගාස්තු ගෙවීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට විරුද්ධව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති පහත සඳහන් නඩු සඳහා නීතිඥ ගාස්තු ලෙස එක් නඩු කටයුත්තක් වෙනුවෙන් රු.600,000.00 බැගින් අයකරන බවත් එහි අත්තිකාරම් මුදලක් ලබා දෙන ලෙසත් නීතීඥ හරීන්ද්‍ර රාජපක්ෂ මහතා ඉල්ලීම් කර ඇත. එබැවින් අත්තිකාරම් මුදලක් නීතිඥ මහතා හට ගෙවීම් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- සරත් නාවුලගේ මයා - බිබිල මොණරාගල හන්දිය ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට අනවසර ඉදිකිරීම
- ක්‍රිෂන් කුමාර මයා - බිබිල මොණරාගල හන්දිය ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට අනවසර ඉදිකිරීම

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

2022.07.22 දින අනවසර ඉදිකිරීමක් ලෙස සරත් නාවුලගේ මහතාට හා ක්‍රිෂන් කුමාර මහතාට විරුද්ධව බිබිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත් බිබිල මහේස්ත්‍රාත් අධිකරණය මගින් මෙම කඩ කාමර දෙක අනවසර ඉදිකිරීමක් බැවින් කඩා ඉවත් කරන ලෙස නඩු තීන්දුව ලබාදී ඇති අතර ප්‍රතිශෝධන පෙත්සම මොණරාගල දිසා අධිකරණයේ විභාග කර ඇති අතර එමගින්ද මෙම

කඩ කාමර කඩා ඉවත් කරන ලෙස නියෝග ලබාදී ඇත. මෙම කඩ හිමියන් බිබිල ප්‍රාදේශීය සභාවට විරුද්ධව මේ වන විට කොළඹ අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

මෙම කඩ කාමර ඉතා පැරණි ප්‍රසිද්ධ ව්‍යාපාරික ස්ථාන බවත් මාර්ගය පුළුල් කිරීමේදී මෙම කඩ කාමර අඩි 03ක් පිටුපසට ගෙන ඉදි කරන ලෙස එවකට ප්‍රාදේශීය සභාවේ සභාපති ,සභා ලේකම්, කේ.ලීබට් මහතා කොන්ත්‍රාත්කරු , මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු යන අය වාචිකව උපදෙස් දී ඇති නමුත්, මෙම ව්‍යාපාරික මහතුන් අඩි 05ක්ම පිටුපසට කර ඉදිකර ඇති බව පැවසීය.මෙම කඩ කාමර කඩා ඉවත් කළහොත් එම කඩ දෙපැත්තේ ඇති කඩවල බිත්තිවලට හානියක් සිදුවුවහොත් ඒ සඳහාද ගෙවීම් කිරීමට සිදුවන බව පැවසීය.

මෙම කඩ පිහිටා ඇති භූමිය සභාව සතු නොවන බවත් මේවා කැඩීමෙන් හුදෙක් මෙම ව්‍යාපාරිකයින්ට ව්‍යාපාර ස්ථානයක් නැති කිරීම පමණක් බවත් ප්‍රාදේශීය සභාවට අයිතියක් හෝ කිසිදු වාසියක් සිදු නොවන බවත් එමගින් නඩු සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට මුදල් වැය කිරීමට සිදුවන බව පැවසීය. මොණරාගල හන්දියේ ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට ඉදිකර ඇති අනවසර ගොඩනැගිල්ලෙහි කඩහිමියන්, දැනට පවතින ගොඩනැගිල්ල වෙනුවෙන් කිසියම් සාධාරණ මුදලක් සභාවට ගෙවමින් ගිවිසුම්ගතව කටයුතු කිරීමට කැමති බව තමන් සමඟ පැවසූ බව පැවසීය. මෙම කඩකාමර කඩා ඉවත් කිරීමෙන් ව්‍යාපාරිකයින්ට කඩ අහිමි වනවා පමණක් බැවින් හා බිබිල ප්‍රාදේශීය සභාවට කිසිඳු ආදායමක් උත්පාදනය කිරීමට නොහැකි බැවින් හා භූමියෙහි අයිතිය නොලැබෙන බැවින් මේ අය සමඟ නඩුව දිගටම පවත්වාගෙන යාමෙන් බිබිල ප්‍රාදේශීය සභාවට නීතිඥ ගාස්තු , ගමන් වියදම් වැය වනවාට වඩා ඒ අය සමඟ සමතයකට පත්ව කටයුතු කිරීමට සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

මෙම නඩුව ජයග්‍රහණය කළහොත් එම කඩ කඩා ඉවත් කිරීම පමණක් කළහැකි බවත් භූමියේ අයිතියක් බිබිල ප්‍රාදේශීය සභාවට නොලැබෙන බැවින් මෙම නඩුව සඳහා නීතිඥ ගාස්තු , ගමන් වියදම් මෙන්ම කඩා ඉවත් කිරීමට යන්ත්‍ර සූත්‍ර යෙදවීමේ ඉන්ධන ගාස්තු වැනි වියදම් ම පමණක් බිබිල ප්‍රාදේශීය සභාවට වැයවන බැවින් මෙම කඩ හිමියන් එකඟතාවයකට පැමිණීමට කැමති නම් ඒ අය මෙම නඩුව ඉල්ලා අස්කර ගන්නේ නම් සමතයකට පත්වීම සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා</u>

ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා හා රූපසේන මැතිතුමාගේ අදහසට තමා ද එකඟ වන බවත් බිබිල ප්‍රාදේශීය සභාවට කිසිඳු වාසියක් මෙම කඩ කැඩීමෙන් සිදු නොවන්නේ නම් පළාත් පාලන කොසමාරිස්තුමාගෙන් හෝ ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් උපදෙස් ලබා ගෙන මෙම නඩුව සමතයකට පත්වීම සුදුසු බව පැවසීය. මෙම ව්‍යාපාරික මහතුන්ගෙන් දඩ මුදලක් ලබා ගෙන හෝ ඒ අය සමග සමතයකට පත් වීමෙන් සභාවේ නීතිඥ ගාස්තු වැයවීම අවම කර ගත හැකි බවත් එසේ කළහොත් දිගුකලක් මෙම මන්ත්‍රී මණ්ඩලයේ කීර්තිනාමය පවතින බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා</u>

මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමෙන් සිදුවන්නේ නීතිඥ ගාස්තු , ගමන් වියදම් පමණක් නොව කඩා ඉවත් කිරීමට නඩු තීන්දුව ලැබුණහොත් ඒ සඳහා ද සභාවේ අරමුදල් වැය වන බවත් කිසිඳු අයිතියක් සභාවට නොලැබෙන බැවින් සභා අරමුදල් වැය නොකර එම ව්‍යාපාරිකයින් සමග සමතයකට පත් වන්නේ නම් සුදුසු බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>**

බිබිල ප්‍රාදේශීය සභාවට මෙම නඩුව සඳහා විශාල මුදලක් වැය වී ඇති බැවින් ඒ සඳහා සාධාරණයක් ඉටු කිරීම සඳහා මෙම කඩ කාමර හිමියන් බිබිල ප්‍රාදේශීය සභාවට මුදලක් පිරිනමන්නේ නම් සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා</u>**

මෙතෙක් මෙම නඩුව නිසා බිබිල ප්‍රාදේශීය සභාවට සිදු වී ඇත්තේ පාඩුවක් බවත් කඩා ඉවත් කිරීමට සිදුවුවහොත් එම වියදම් ද බිබිල ප්‍රාදේශීය සභාවට දැරීමට සිදුවන බවත් මෙම නඩුව සඳහා බිබිල ප්‍රාදේශීය සභාව වැය කර ඇති මුදලට සාධාරණයක් ඉටු කිරීමක් ලෙස එම ව්‍යාපාරිකයින්ගෙන් කිසියම් මුදලක් අය කිරීම සුදුසු බවත් එම ව්‍යාපාරිකයින් සමග සමතයකට පත්වීම සුදුසු බවත් පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>**

මෙම නඩුව දිගින් දිගටම පවත්වාගෙන යාමෙන් සිදු වන්නේ දෙපාර්ශවයටම මුදල් වැයවීම පමණක් බවත් සභාව මෙම නඩුව ජයග්‍රහණය කළද කිසිදු ප්‍රතිලාභයක් සභාවට නොලැබෙන බවත් එම ව්‍යාපාරිකයින්ට කඩ කාමරය අහිමි වීම පමණක් සිදුවන බැවින් නීතිඥ ගාස්තු වශයෙන් මුදල් වැය නොකර ඒ අයගෙන් බිබිල ප්‍රාදේශීය සභාවට සාධාරණ ප්‍රදානයක් ලබා ගෙන සමතයකට පත් වන්නේ නම් සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා</u>**

ආදාහනාගාරයේ වාර සේවාවට වැය වන මුදල රුපියල් ලක්ෂ 2ක පමණ මුදල වැඩි යැයි මන්ත්‍රී මණ්ඩලයටම හැඟුණ බවත් , නමුත් කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව මෙවන් විශාල මුදලක් නඩු කටයුත්තක් සඳහා වැය කිරීම අසාධාරණයක් බවත් මෙම මුදල් වැය කර සභාවට කිසිදු වාසියක් සිදු නොවන්නේ නම් ව්‍යාපාරිකයින් සඳහා ව්‍යාපාර ස්ථාන නැති නොකර නීතිමය රාමුවක් තුළ හැකියාවක් තිබේ නම් සමතයකට පත්වීමට සුදුසු බව පැවසීය.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

මෙම නඩුව සරත් නාවුලගේ මහතා හා ක්‍රිෂන් කුමාර මහතා බිබිල ප්‍රාදේශීය සභාවට විරුද්ධව කොළඹ අභියාචනාධිකරණයේ ගොනු කර ඇති නඩුවක් බැවින් මෙම නඩුව පිළිබඳ සමතයකට පත්වීම පිළිබඳ නීතිමය රාමුවකට යටත්වන බවත් පෞද්ගලිකව තමා මෙම කඩ කාමර කඩා ඉවත් කිරීමට අකමැති වුවත් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී අනුකූලතාවය ලබා නොගැනීම නීත්‍යානුකූල නොවන බව පැවසීය.

මෙම නඩුව පැටලිලි සහගත බවත් මේ පිළිබඳව සමතයකට පත් වන්නේ නම් ඒ පිළිබඳව නීතිඥවරයාගෙන් නීති උපදෙස් ලබා ගැනීමට සිදුවන බවත් ඒ අනුව එම කටයුතු කළහැකි බවත් පැවසීය. ගරු අභියාචනාධිකරණයෙන් නඩුව මෙම ව්‍යාපාරිකයින් ඉල්ලා අස් කර ගතහොත් දිසාධිකරණයේ තීන්දුව බලාත්මක වන බව පැවසීය. මෙම මන්ත්‍රී මණ්ඩලය සහිත ප්‍රාදේශීය සභාව මගින් මෙම කඩ කාමර කඩා ඉවත් නොකළද ඉදිරියට පත්වන සභාපතිවරයෙකු ඇතුළු මන්ත්‍රී මණ්ඩලයකට මෙම කඩ කාමර කඩා ඉවත් කිරීමට හැකියාවක් පවතින බව පැවසීය.

මෙම නඩුව සඳහා තීරණයක් ලබා ගැනීම ඉතාම සංකීර්ණ කටයුත්තක් බවත් ගරු සභාව තීරණයක් ලබා ගැනීමට පෙර මෙම නඩුව වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයාගෙන් නීති උපදෙස් ලබාගත යුතු බවත් එසේම පනතේ බලතලවලට යටත්ව කටයුතු කළයුතු බවත් පැවසීය. මීට පෙර පැවති සභාවක් ගරු සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩල හා සභා ලේකම් මගින් ගොනු කර ඇති නඩුවක් බැවින් මේ පිළිබඳව අභියාචනාධිකරණයේ දී සමතයකට පත්වීමට ගරු සභාව මගින් තීරණයක් ගතහොත් එහිදී සභාපතිතුමා ඇතුළු මෙම මන්ත්‍රී මණ්ඩලයට අගතියක් සිදු නොවන ආකාරයේ තීරණයක් ගතයුතු බව පැවසීය. මෙම නීතිඥවරයාගෙන් නීති උපදෙස් ලබා ගැනීමට නම් එම නඩුවට පෙනී සිටින නීතිඥවරයාට නඩු ගාස්තු වෙනුවෙන් අත්තිකාරමක් ගෙවීමට සිදුවන බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල මොණරාගල හන්දිය ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට සරත් නාවුලගේ හා ක්‍රිෂන් කුමාර යන අය අනවසරව ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් ව්‍යාපාරික මහතුන් විසින් කොළඹ අභියාචනාධිකරණයේ ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් මෙම නඩු සඳහා පෙනී සිටින නීතිඥවරයාගෙන් නීති උපදෙස් ලබාගෙන එම ව්‍යාපාරිකයින් සමග සාකච්ඡා කර මෙම නඩුව සමතයකට පත් වන්නේද එසේ නැතිනම් ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න පිළිබඳ තීරණයක් ගැනීමට ඉදිරි සභාවකට කල් තබන ලදී.

## (ඉ).01.15. 20KVA ජෙනරේටරය සේවා කිරීම සම්බන්ධවයි.

Trade Promoters (Pvt) Limited ආයතනයෙන් බිබිල සංස්කෘතික මධ්‍යස්ථානයේ සවිකර ඇති 20 KVA ජෙනරේටරය සේවා කිරීම සඳහා රු.88358.40 ක සේවා ගාස්තු ගෙවීමක් සිදුකල යුතු බව එම ආයතනය දැනුම් දී ඇත. එම ආයතනය සඳහා රු.88358.40 ක සේවා ගාස්තු ගෙවීම් කර ජෙනරේටරය සේවා කිරීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු සභාපති වීත සරත් විදානගම මැතිතුමා</u>

බිබිල සංස්කෘතික මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති ජෙනරේටරය මේ වනවිට අකර්මන්‍ය වී ඇති බැවින් සේවා කිරීමට වඩා අලුත්වැඩියා කිරීමට සිදුවන බව පැවසූ අතර අලුත්වැඩියා කිරීමේ දී සවිකිරීම් උපාංග මිලදී ගැනීමට සිදුවුවහොත් මෙම වාර සේවා ගාස්තුවට වඩා මුදලක් වැය වන බව පැවසීය. සංස්කෘතික මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් පවත්වන බැවින් විදුලිය අකර්මන්‍ය වූ අවස්ථාවක මෙම ජෙනරේටර් සේවාව අත්‍යාවශ්‍ය බැවින් අලුත්වැඩියා කළයුතු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.16. බිබිල මහජන පුස්තකාලයේ එළිමහන් කියවීම සඳහා කොන්ක්‍රීට් පුටු ලබා ගැනීම.

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල මහජන පුස්තකාලයේ එළිමහන් කියවීමේ ශාලාව සඳහා කොන්ක්‍රීට් පුටු 10ක් මිලදී ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහ සම්මත විය.

## (ඉ).01.17.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍රවල ඉන්ධන දහන පරීක්ෂාව සඳහා කමිටුවක් පත් කිරීම.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා 2026 වර්ෂයට අදාළව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය බැවින් පහත නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ඩබ්.එම්.ඒ.බී.අත්තනායක මයා (කාර්මික නිළධාරි) - සභාපති
- ඒ.ඩී.එල්.පී.කැටවත්ත මයා (සංවර්ධන නිළධාරි) - සාමාජික
- ටී.එච්.සුමිත් සෝමරත්න මයා (සංවර්ධන නිළධාරි - සාමාජික

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා</u>

මෙය වාර්ෂිකව සිදු කරනු ලබන ඉන්ධන දහන පරීක්ෂාවක් දැයි විමසා සිටි අතර මෙම වාහන වල ඉන්ධන දහනය වන ප්‍රමාණය ගණනය කිරීම සඳහා කාර්යාලයේ මෙම නිළධාරීන්ට අවබෝධයක් නොමැති බවත් අවම වශයෙන් විධායක ඉංජිනේරුවන් තිදෙනෙකුවත් මෙම කමිටුව සඳහා ඇතුළත් වියයුතු බවත් කහගොල්ල පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයේ ඉන්ජිනේරු මහතුන්ගේ සහයෝගය මේ සඳහා ලබා ගැනීමට සුදුසු බව පැවසීය. වාහන ක්ෂය වීමත් සමඟ මෙම ඉන්ධන ප්‍රමාණයන් වෙනස් වන බවත් මෙහිදී කන්දට, පල්ලමට, තැන්නට වාහනයකින් දහනය වන ඉන්ධන ප්‍රමාණ තීරණය කරන බැවින් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම අව්‍යශය බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

ගරු මන්ත්‍රී අත්තනායක මැතිතුමාගේ අදහස ඉතා වැදගත් බවත් මෙහිදි මෙම ඉන්ධන දහන පරීක්ෂාව ඉතා ඉක්මණින් සිදු කිරීමට අවශ්‍ය බවත් එබැවින් මෙම නිළධාරි මණ්ඩලය පත් කළ බවත් ඉන්ජිනේරු මහතුන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළහොත් මේ සඳහා දිගු කාලයක් වැයවන බව පෙන්වා දෙන ලදී. බිබිල ප්‍රාදේශීය සභාවේ රියදුරු මහතුන් නිසි පරිදි ඉන්ධන භාවිතා කරනවාදැයි සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණ බව පැවසූ අතර එබැවින් මෙය සරල පරීක්ෂාවකින් තීරණය කිරීමට මෙම නිළධාරි මණ්ඩලය පත් කරමු යැයි පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.18. කණුල්වෙළ එළ ගවමස් වෙළඳසැල බදු කාලසීමාව 2026.03.31 දිනැතිව අවසන් වීම සම්බන්ධවයි.

2025.12.05 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීම් වාර්තාවට අනුව කණුල්වෙල එළගවමස් ව්‍යාපාරය 2026.01.01දින සිට 2026.03.31 දින දක්වා මෙම වෙළඳසැල පවත්වාගෙන ගිය අබ්දුල් මුනාෆ් මහතා හටම පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දීමටත් 2025 වර්ෂයේ අයකළ වාර්ෂික කුලිය වන රු.630,000.00 ක මුදලට 10% ක් වැඩි කර කුලී අයකළයුතු බවත් එවිට මෙම ව්‍යාපාරික මහතාගෙන් මාසික කුලිය ලෙස රු.57,750.00 ක් හා ඇපතැන්පතු මුදල 173,250.00 ක් අය කිරීමටත්, 2026.04.01 සිට 2026.12.31 දින දක්වා කාලයට කණුල්වෙල එළගවමස් ව්‍යාපාරය සඳහා කඩ කාමරයක් සොයාගෙන එම කඩකාමරය ටෙන්ඩර් කර බදු ලබාදීමටත් සුදුසු බව තීරණය කර ඇත.

ඒ අනුව එච්.එම්.ඒ.මුනාෆ් මහතා වෙත 2026.01.01 දින සිට 2026.03.31 දින දක්වා කාලසීමාවට බදු ලබාදීම අප විසින් සිදු කරන ලදි.

එසේම ගරු සභාපති/උප සභාපති/කාර්මික නිළධාරි ඇතුළු පිරිස කණුල්වෙල, ප්‍රදේශයේ 2026.03.02 දිනැතිව ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ඇත.

තම කඩකාමරය මෙම එළගවමස් ව්‍යාපාරය සඳහා බදු ලබාදීමට කැමැත්ත පලකර තිබූ එම්.ආර්.තාජුදීන් මහතාගේ කඩ කාමරයද පරීක්ෂාවට ලක්කර ඇත.අනතුරුව ලිපියක් යොමුකර ඒ මහතා කැඳවන ලදි . සභාපතිතුමන් සමග සාකච්ඡාවට අවස්ථාව ලබා දෙන ලදි.

වසරේ ඉදිරි කාලසීමාව සඳහා කඩකාමරයක් බදු ගැනීමේ දී පහත ක්‍රමවේදය අනුගමනය කළයුතු වේ. එක් පුද්ගලයෙකුගෙන් පමණක් මස් කඩයක් බදු ලබා ගැනීම ගැටළු සහගතය. එබැවින් අතුරු ව්‍යවස්ථානුකූලව මස් කඩයකට අවශ්‍ය නිර්ණායක ලබාදී බිබිල කණුල්වෙල ප්‍රදේශයෙන් ඒ සඳහා සභාව වෙත ලංසු ඉදිරිපත් කරන ලෙස දන්වා එසේ ඉදිරිපත් කරන කඩ හිමිකරුවන්ගෙන් සුදුසු කඩකාමරයක් තෝරා බද්දට ගැනීමෙන් පසු 2026 වර්ෂයේ බදු ලබාදෙන කාලසීමාව සඳහා අවම ලංසුව මහ සභාව මගින් හෝ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තීරණය කර ගැනීමෙන් අනතුරුව නැවත මස් වෙළඳාම සිදු කිරීම සඳහා ටෙන්ඩරයක් කැඳවා බදු ලබාදීම සිදු කළ යුතුව ඇත.මේ සඳහා ගතවන කාලය නිශ්චිතව තීරණය කළ නොහැකි බැවින් එතෙක් මෙම ව්‍යාපාරය කරගෙන යාම සඳහා පැරණි බදුකරුට පැවරීමට හෝ ඒ සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා**

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය පිළිබඳව මීට පෙර සභා වාර කිහිපයකම සාකච්ඡා කළ අතර මෙම එළගව මස් ව්‍යාපාර ඉතාමත් අඩු මුදලක් සභාවට ගෙවීම් කර පවත්වා ගෙන යන බැවින් සභාවට

ලැබෙන ආදායම් අඩුවී ඇත. 2025 දෙසැම්බර් 05 විශේෂ මහ සභාව මගින් දැනට ව්‍යාපාරය පවත්වාගෙන යන ව්‍යාපාරික මහතාටම කී මනි හා මාසික කුලිය 10% ක මුදලක් වැඩි කර මාස තුනක කාලයක් කරගෙන යාමට අවස්ථාව ලබාදුන් අතර ඉන්පසු කණුල්වෙල ප්‍රදේශයේ කඩ කාමරයක් ලබා ගෙන එම කඩ කාමරය ටෙන්ඩර් කර ලබා දීමට තීරණය කළද එම කාලසීමාව අවසන් වීමට ආසන්න වුවද කඩ කාමරය පරීක්ෂා කිරීමට ගොස් ඇත්තේ මාස තුන අවසන් වීමට ආසන්න දිනයක් වූ 2026 මාර්තු 02 දින බැවින් ගරු සභාපතිතුමා මේ සඳහා මැදිහත් වීමක් සිදු නොකළ බව පෙනී යන බවයි. මෙසේ සිදුකළ හොත් 2026 වර්ෂය සඳහාත් අඩු මුදලකට පැරණි ව්‍යාපාරික මහතාටම ලබා දීමට සිදුවන බවත් එමගින් සභාවට හිමිවීමට ඇති ආදායම අහිමි කර ගැනීමක් සිදුවන බවයි. කඩ කාමරයක් නොමිලේ ලබා දීමට පුද්ගලයෙක් කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඒ පිළිබඳව හැකි ඉක්මණින් සොයා බලා ගරු සභාපති තුමා මැදිහත් වී එළ ගවමස් ව්‍යාපාරය ටෙන්ඩර් කර ලබා දී සභාවට හිමි වීමට ඇති ආදායම උත්පාදනය කර ගැනීමට කටයුතු කරන ලෙසයි.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා</u>

බදු ලබා ගැනීමේදී එක් කඩ කාමරයක් ප්‍රමාණවත් නොවන බැවින් කඩ කාමර තුනක් අවශ්‍ය බැවින් මෙම කණුල්වෙල එළ ගවමස් ව්‍යාපාරය පැරණි බදුකරුවාටම ලබා දීමට කටයුතු කරන බව දක්වා ඇතත් මෙහිදී එම්.ආර්. තාජුදීන් මහතා නොමිලේ කඩ කාමරය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යැමට අවශ්‍ය නොවන බව පැවසීය. ගරු සභාපතිතුමා ගරු සභාව නොමග නොයවන ලෙස පැවසූ අතර පෙර සභාවේදී ටෙන්ඩර් ක්‍රියාවලියට කාලයක් අවශ්‍ය බව පැවසූ බවත් එබැවින් ගරු සභාව මාස තුනක කාලයක් ලබාදුන් බවත් මෙම කඩ කාමරය පරීක්ෂාවට ගොස් ඇත්තේ ලබා දුන් මාස තුන අවසාන කාලයේ බවත් ප්‍රසම්පාදනය කිරීමට දින 14ක වත් කාලයක් නොමැති වන ලෙස බැවින් මෙය සභාව නොමග යැවීමක් බව පැවසීය. මෙම සභාවෙහි මන්ත්‍රී මණ්ඩලය බුද්ධිමත් බැවින් මෙය අවබෝධ වන බවත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියළු දෙනාටම කොලේ වසා ගැසීම නවත්වන ලෙස පැවසීය.

නොමිලේ කඩ කාමරයක් ලබාදිමට කැමැත්ත පල කර තිබෙනවා නම් එළ ගවමස් ව්‍යාපාරය ටෙන්ඩර් ලබා දීමට හැකියාව තිබෙන බවත් එබැවින් සභාවට ලැබීමට ඇති ආදායම අහිමි කිරීමට කටයුතු නොකරන ලෙසත් මෙම ගරු සභාව බිබිලේ ජනතාවට අසාධාරණයක් නොකරන ලෙසත් ලැබීමට ඇති ආදායම අහිමි නොකර සභාවට මූල්‍යමය පාඩුවක් නොකර මෙම ව්‍යාපාරය ටෙන්ඩර් කර ආදායම උත්පාදනය කර ගන්නා ලෙස පැවසීය. කණුල්වෙල එළගවමස් ව්‍යාපාරය 2026 වර්ෂයේ අවසන් මාස 9 ට හෝ ටෙන්ඩර් කර ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය විවෘත ටෙන්ඩරයකට යනු ලැබුවේ බිබිල ප්‍රාදේශිය සභාව සතු කඩ කාමරයක් නොමැති නිසා බවත් 2026 දෙසැම්බර් 05 විශේෂ මහ සභාවෙන් තීරණය කරනු ලැබුවේ 2026 ජනවාරි 01 දින සිට 2026 මාර්තු 31 දින දක්වා මාස තුනක කාලය තුළ කණුල්වෙල ප්‍රදේශයෙන් එම්. තාජුදීන් මහතාගේ කඩ කාමරය හෝ සුදුසු කඩ කාමරයක් සොයා ගෙන ටෙන්ඩර් කිරීමටයි.

දෙසැම්බර් මාසයේ ලබාගත් තීරණයට අදළව කඩ කාමරය පරීක්ෂාවට ගොස් ඇත්තේ ලබාදුන් කාලසීමාව අවසන් වීමට ආසන්න කාලයක බවත් මාර්තු මස 02වන පොහොය දිනයේ බවත් , එළගවමස් ව්‍යාපාරයක් කිරීමට සුදුසු කඩ කාමරයක් නිරීක්ෂණය කිරීමට පොහොය දිනයක යැම ප්‍රාදේශීය සභාව හා නිළධාරි හැල්ලුවට ලක්කිරීමක් බව පැවසීය.

කණුල්වෙල ප්‍රදේශයේ ජනතාව තුළ මේ පිළිබඳව යටින් ගනුදෙනුවක් තිබෙනවා යැයි කටකතාවක් යන බවත් එසේ සිදු නොවුණත් මෙම කටකතා යැමට හේතුව වන්නේ ගරු සභාව මගින් සෘජුව

තීරණයක් ලබා නොගැනීම බව පැවසීය. එම්.ආර්.තාජුදීන් මහතා කඩ කාමරයක් නොමිලේ ලබා දීමට ඉදිරිපත්ව ඇති බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යැමට අවශ්‍ය නොවන බවත් කඩකාමරය පිළිබඳ ස්ථානීය පරීක්ෂාවක් කර මෙම කඩ කාමරය එළ ගවමස් ව්‍යාපාරය සඳහා ටෙන්ඩර් කිරීමට හැකියාව තිබුණද වැඩිම අලෙවියක් සිදුවන අප්‍රේල් මාසය තුළ මෙය පවත්වා ගෙන යන ව්‍යාපාරිකයාටම එළගව මස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදීමට බව පැවසීය. පෙර පැවති ආණ්ඩුවලින් මෙවන් ක්‍රියාවන් සිදුවූවා යැයි නිතර පවසන හොර බොරු වංචාවෙන් තොරව පවත්වා ගෙන යනු ලබන ආණ්ඩුවක් යැයි පවසන පාලන ක්‍රමය තුළ මෙවන් ක්‍රියා පැවතීම සුදුසු ක්‍රියාවක් නොවන බව පැවසීය.

විපක්ෂය ලෙස සභාව අපහසුතාවයට පත් වන ආකාරයේ ක්‍රියාවක් සිදු නොකරන බවත් සභාවට ආදායම් උත්පාදනය කළහැකි නිවැරදි යෝජනාවක් සඳහා සහයෝගය ලබා දෙන බවත් මාධ්‍යයන්ට ආරාධනා කර මාධ්‍යවේදීන් මෙම ගරු සභාවට කැඳවා සභාව අපහසුතාවයට පත් කරන ආකාරයේ ක්‍රියාවන්ද නොකරන බව පැවසීය.

කණුල්වෙල ඇති මෙම කඩ කාමරයෙහි නීතිමය වශයෙන් සිදු කර ගැනීමට ඇති කාර්යන් සම්පූර්ණ කරගෙන අප්‍රේල් මස 01 වනදා වන විට ටෙන්ඩර් කර කණුල්වෙල එළ ගවමස් ව්‍යාපාරය බදු ලබා දීමට කටයුතු කරන ලෙසත් දැනට පවත්වාගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම එළ ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවස්ථාව ලබා නොදෙන ලෙස පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

කණුල්වෙල එළ ගවමස් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති කඩ කාමර මන්ත්‍රී මණ්ඩලයේ කවුරුන් හෝ ගොස් පරීක්ෂා කළේද ? එසේත් නැතිනම් ඡායා රූපයක්වත් ගෙන්වා ගෙන බැලුවේදැයි ප්‍රශ්න කරන ලදී. කඩ කාමර ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර සභාව වෙත ලිපි එවා ඇති සමහර මහත්වරු ලිපි නොඑවූ බවත් සමහර මහත්වරු ලිපි පිළිබඳ තමන් කිසිඳු තොරතුරක් නොදන්නා බවත් , මෙම ලිපිවල ඇති අත්සන් තමාගේ නොවන බවත් පවසා ඇති බවත් සමහර කඩ කාමර තිබෙන බව පැවසූ ස්ථානයට ගියපසු එවැනි කඩ කාමරයක් ඇත්තෙත් නැති බවත් පැවසීය. එබැවින් මෙම ලිපි සියල්ල එක් පුද්ගලයෙකු විසින් සභාව වෙත එවන්නට ඇතැයි විශ්වාස කරන බව පැවසීය.

එළ ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සභාවට නොමිලේ ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති එම්.ආර්. තාජුදීන් මහතාගේ කඩ කාමරය එළ ගවමස් ව්‍යාපාරයකට නොව පොල්කටු විකිණීමටවත් සුදුසු නොවන ස්ථානයක් බවත් මෙම කඩ කාමරය සභාවට ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කළද කිසිදු පිරිසිදු කිරීමක් සිදු නොකළ වහළය තැනින් තැන කැඩී පහත් වී ඇති රාක්ක කැඩී විනාශ වී ඇති විවිධ කෘමි සතුන් ගෙන් පිරී ඇති ස්ථානයක් බව පැවසීය.

සභාපතිවරයා වන තමා යටින් ගේමක් රැගෙන යන බව මන්ත්‍රී මණ්ඩලය පවසන්නේ නම් මෙම අවස්ථාවේම මෙම සභාව පැය ½ කට අඩාල කර කඩ කාමරයේ ස්ථානීය පරීක්ෂාවක් කර ගෙන ඒමට සභාවේ වාහන දෙකම ලබා දෙන්නට කටයුතු කරන බවත් ඔබ යැමට කැමති දැයි සභාපති තුමා ගරු සභාවෙන් ප්‍රශ්න කරන ලදී. ඒ අවස්ථාවේ කිසිඳු මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් නොවූ අතර මෙම මන්ත්‍රී මණ්ඩලය මෙලෙස චෝදනා කිරීමට පෙර මෙම කඩ කාමරය පිළිබඳ භෞතිකව පරීක්ෂා කිරීමට නොපෙළඹීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන ලදී. ගරු සභාව විසින් මෙම කඩ කාමරය අලුත්වැඩියා කිරීමට තීරණය නොකළ බවද පැවසීය.

එම්.ආර්. තාජුදීන් මහතා විසින් අප්‍රේල් මාසයේ දී ගවමස් වැඩිම අලෙවියක් සිදුවන බවත්, එබැවින් මෙය ටෙන්ඩර් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කළ බවත් ඔහුටද මෙම කඩ කාමරය පිරිසිදු කර මස් අලෙවියට සුදුසු ස්ථානයක් බවට පත් නොකිරීම පිළිබඳව පෙන්වා දුන් බවත් මෙය නිසි පරිදි අලුත්

වැඩියා කර මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා ගෙන් මෙහි එළගව මස් ව්‍යාපාරය සිදුකර ගෙන යාහැකි බවට සහතික සහිතව සභාවට භාර දෙන ලෙස දැනුවත් කළ බව පැවසීය.

එම්.ආර්. තාජුදීන් මහතා ව්‍යාජ ලෙස කටයුතු කරන බැවින් මෙම කඩ කාමරය සභාවට ලබා ගැනීමේදී නීතිමය වශයෙන් බදු ගිවිසුමකට යටත්ව ලබා ගැනීමට කටයුතු කළයුතු බවත් එම කඩ කාමරය එළ ගවමස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සුදුසු ආකාරයට සකස් කර දීමට කාලයක් ලබා දීමට අවශ්‍ය බැවින් මෙම එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වාගෙන යනු ලබන එච්.එම්.ඒ. මුනාෆ් මහතාටම ඉදිරි මාස දෙක තුළ ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවසර ලබා දියයුතු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට එළගව මස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට නොමිලේ කඩ කාමරයක් ලබා දෙන එම්.ආර්. තාජුදීන් මහතාගේ කඩ කාමරය එළගව මස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සුදුසු ලෙස අලුත්වැඩියා කර, එළගව මස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සුදුසු බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නිර්දේශ සහිතව බිබිල ප්‍රාදේශීය සභාවට භාර දෙන තෙක්, දැනට එළගව මස් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම පිළිබඳව බෙදීමක් අවශ්‍ය බවත් එබැවින් ඡන්දයක් පැවැත්විය යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කර ලදී.

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඡන්දය පැවැත්වීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සභා ලේකම් අනුෂා එස්. දිසානායක මිය එදින මහ සභාව සඳහා සහභාගී නොවීම නිසා ගරු සභාවේ සභා ලේකම්ගේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා රාජකාරි පවරා ඇති ප්‍රධාන කළමණාකරන සේවා නිළධාරි එන්.එම්.දික්කුඹුර මිය විසින් ඡන්දය පවත්වා එහි ප්‍රතිඵලය ගරු මූලාසනය වෙත භාර දෙන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම පිළිබඳව පැවැත්වූ ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි වේ.

| අනු අංකය | මන්ත්‍රීතුමාගේ /තුමියගේ නම | පක්ෂව ඡන්දය ලබා දුන් ගණන | විපක්ෂව ඡන්දය ලබා දුන් ගණන | ඡන්දය දීමෙන් වැලකී සිටි ගණන | ඡන්ද විමසීම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ගණන | රැස්වීමට සහභාගි වූ ගණන |
|---|---|---|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මැතිතුමා | √ | | | | √ |
| 02 | එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | √ | | | | √ |
| 03 | ආර්.බී.අත්තනායක මැතිතුමා | | √ | | | √ |
| 04 | ඩබ්.එම්. රූපසේන මැතිතුමා | √ | | | | √ |
| 05 | බී.එම්. වීරසේකර මැතිතුමා | √ | | | | √ |
| 06 | ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | √ | | | | √ |
| 07 | ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | √ | | | | √ |
| 08 | ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | √ | | | | √ |
| 09 | පී.ජයන්ති මැතිතුමිය | √ | | | | √ |
| 10 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | √ | | | | √ |
| 11 | ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | √ | | | | √ |
| 12 | පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | | | | √ | √ |
| 13 | එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | | √ | | | √ |
| 14 | කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | | √ | | | √ |
| 15 | ඩබ්.එම්.එම්.ඩබ්.පී. සමරකෝන් මැතිතුමිය | | √ | | | √ |
| 16 | එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | | √ | | | √ |
| 17 | ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | | √ | | | √ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 18 | ජේ.ඒ.ජී. වී. වර්ණකුලසූරිය මැතිතුමා | | | | √ | √ |
| එකතුව | | 10 | 06 | 00 | 02 | 18 |

ඒ අනුව කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම පිළිබඳව

පක්ෂව ජන්ද - 10
විපක්ෂව ජන්ද - 06
ඡන්දය ලබා දීමෙන් වැලකී සිටි - 00
සභා ගර්භයේ නොසිටි - 02

ඒ අනුව මන්ත්‍රීවරු 16 දෙනෙකු ඡන්දය ප්‍රකාශ කර ඇති අතර කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම වැඩි ඡන්ද 04කින් සභා සම්මත වූ බව ගරු මූලාසනය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඒ අනුව කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන එච්.එම්.ඒ.මුනාෆ් මහතාටම 2026.04.01 දින සිට 2026.05.31 දින දක්වා මාස දෙක තුළ පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීම බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**(ඉ).01.19.කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පැනවූ දිනවල සහ රටේ පැවති තත්වය මත හිඟ බදු කුලී මුදල් ලේඛණ වලින් ඉවත් කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිම සම්බන්ධවයි .**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.06.24 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.03 අනුව කොරෝනා සමය තුල ඇඳිරි නිතිය ක්‍රියාත්මක වූ බැවින් කඩ කාමර වසා තිබූ බව සියළු දෙනාට නොරහසක් නොවූවද නගරයේ කඩ හිමියන්ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන හා සනාථ කල හැකි ලියවිලි සපයාගෙන මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරිම සඳහා කල් තැබිමට තීරණය කර ඇත.

ඒ අනුව මගේ අංක BPS/03/10 හා 2025.08.12 දිනැති ලිපි මඟින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරික ස්ථාන වසා තැබුවා යැයි ලිපි ලබා දී ඇති කාලසිමාවන්ට අදාලව දිවුරුම් ප්‍රකාශ සහ සනාථ කල හැකි ලියවිලි කඩිනමින් ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කර ඇති නමුත් එකදු බදු කරුවකු විසින් හෝ මේ සම්බන්ධව දිවුරුම් ප්‍රකාශ හෝ ලිපි ඉදිරිපත් කර නැත.

ඒ අනුව 2021 වර්ෂයට අදාලව කොවිඩ් 19 හේතුවෙන් ටෙන්ඩර් මගින් බදු දෙනු ලබන දේපල වලින් රු.1,624,814.69 ක මුදලක් අයවීමට ඇති අතර මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා සුදුසු තීරණයක් ගැනිමට ගරු සභාවට යෝජනා කරමි.

**ලිපි යොමුකරන ලද කඩ විස්තරය**

| අනුඅංකය | දේපල | බදුකරුගේ නම | සහන ලබාදීමට තීරණය නරන ලද කාලසීමාව | සභාතීරණ ගෙන සහන ලබාදී ඇති කුලී මුදල |
|---|---|---|---|---|
| 1 | ඌරු මස් වෙළඳසැල | ටී.එම්.චමිලා වසන්ති මිය | 2021.මැයි/ජුනි/අගෝස්තු/ සැප්තැම්බර් | 77,777.60 |
| 2 | අංක 03 මුහුදුමාළු වෙළඳසැල | ඒ.එම්.ශාන්ත කුමාර මයා | 2021 අගෝස්තු /සැප්තැම්බර් | 73,804.44 |
| 3 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | එම්.ඒ.ඉෂාර ධනංජය මයා | 2021 මැයි/ජුනි/අගෝස්තු/සැප්තැම්බර්/නොවැම්බර් | 238,588.32 |
| 4 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | ජේ.ඒ.රනුක ශ්‍රීමාල් මයා | 2021මැයි/ජුනි/අගෝස්තු /සැප්තැම්බර් | 326,502.74 |
| 5 | බස්නැවතුම්පොළ පොදු වැසිකිළිය | ප්‍රදේශීය සභා සේවක සුභසාධක සංගමය | 2021 අප්‍රේල්/මැයි/ජුනි/ජුලි/අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර් | 128,569.84 |
| 6 | බිබිල සතිපොළ | අයි.ඩබ්ලිව්.ඒ.කැළුම් සුරංග මයා | 2021මැයි/ජුනි/ජුලි/අගෝස්තු /සැප්තැම්බර් | 531,082.50 |
| 7 | පිටකුඹුර සතිපොළ | එම්.පී.බී.එන්.ජයවීර මයා | 2021අප්‍රේල්/මැයි/ජුනි/ජුලි/ අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර් | 117,525.00 |
| 8 | මීරිදියමාළු වෙළඳසැල | එම්.ඒ.ඉෂාර ධනංජය මයා | 2021 මැයි/ජුනි/අගෝස්තු/සැප්තැම්බර්/නොවැම්බර් | 130,964.25 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පැනවූ දිනවල සහ රටේ පැවති තත්වය මත බිබිල ප්‍රාදේශීය සභාවට හිමි කඩ කාමර වල ව්‍යාපාර කටයුතු සිදු කරනු ලැබූ බදුකරුවන්ගේ හිඟ බදුකුලී මුදල් ලේඛන වලින් ඉවත් කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිසතුමා මගින් පළාත් පාලන කොමසාරිස්තුමා මගින් අමාත්‍යාංශ ලේකම්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන හිඟ කුලී මුදල් ලේඛන වලින් ඉවත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.20. ළමා උද්‍යානය අසල කිරිහල සම්බන්ධවයි.

බිබිල ළමා උද්‍යානය අසල කිරිහල බදු ගිවිසුම්කරු වන එච්.එම්.සී.සිරිවර්ධන මිය විසින් 2026.03.05 දිනැතිව ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මඟින් අලෙවිසැල නවීකරණය කර ගැනිමට අවසර ඉල්ලා ඇත

ඒ අනුව 2020.06.29 දින පැවති සභා රැස්වීමේදී සභා සම්මත කර තීරණය කරන ලද අංක 08.01 තීරණයට යටත්ව
."බිබිල ළමා උද්‍යානයේ කිරිහල ඉදිකර ඇති ස්ථානයේ ඉදිකිරිමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන තෙක් කිරිහල පවත්වාගෙන යාමටත් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ඕනෑම මොහොතක ඉවත්වීමේ එකඟතාවය මත පලමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත බිබිල ළමා උද්‍යානයේ කිරිහල පවත්වාගෙන යාම සඳහා අවසර දීම සම්බන්ධයෙන් එකී පාර්ශවය විසින් ඇති කර ගන්නා ලද ගිවිසුම් පත්‍රයයි"
කොන්දේසිය හා අනු කොන්දේසි සහිතව ගිවිසුම් කාල පරිච්ඡේදයක් රහිතව ගිවිසුම්ගත වී ඇත.
එසේම ලිපි ගොනුව පරික්ෂා කිරිමේදි කිරිහල සඳහා විදුලිය ලබා ගෙන ඇත්තේද බදුකරුගේ නමට බව නිරික්ෂණය වේ.

ඒ අනුව එච්.එම්.සිරිවර්ධන මියගේ ඉල්ලිමට අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනිම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

බිබිල ළමා උද්‍යානය අසල කිරිහල බදු ගිවිසුම්කරු වන එච්.එම්.සී. සිරිවර්ධන මිය සමග ගිවිසුම කාල පරිච්ඡේදයක් රහිතව ගිවිස ගැනීම ප්‍රශ්නයක් බව පැවසීය. අලුත්වැඩියා කිරීම සඳහා කාර්මික නිළධාරි මහතා මගින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදලින් සිදු කිරීමටත් බදුකරු නමින් ලබාගෙන ඇති විදුලිය සැපයුම බිබිල ප්‍රාදේශීය සභාව නමට හරවා ගැනීමට කටයුතු කළයුතු බවත් 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළයුතු බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

ළමා උද්‍යානය අසල ඇති කිරිහල සහා අරමුදලින් අලුත්වැඩියා කිරීම සුදුසු බවත් විදුලිය බදුකරුගේ නමින් පැවතීම සභාවට ප්‍රශ්නයක් නොවන බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ළමා උද්‍යානය අසල කිරිහල අලුත්වැඩියා කිරීම සඳහා කාර්මික නිළධාරි මගින් ඇස්තමේන්තු සකස් කර බිබිල ප්‍රාදේශීය සභාවේ අරමුදල් යොදවා අලුත්වැඩියා කිරීමටත් , ගිවිසුම්කරුගේ නමින් ලබාගෙන ඇති විදුලි සැපයුම බිබිල ප්‍රාදේශීය සභාවේ නමට හරවා ගැනීමටත් , 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් කර බදු ලබා දීමටත් තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.21. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

2026.03.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. ලිපිද්‍රව්‍ය ගබඩාව සඳහා පහත සඳහන් ආකාරයට මුද්‍රිත ලිපිගොණු ඌව පළාත් සභා මුද්‍රණාලයෙන් මිලදී ගැනීම

| | | |
|---|---|---|
| කහ පාට | - | 250 |
| නිල් පාට | - | 200 |
| රෝස පාට | - | 200 |
| කොළ පාට | - | 250 |
| අවශ්‍ය මුළු මුද්‍රිත ලිපිගොණු ප්‍රමාණය | - | 900 |

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් විථි ලාම්පු ගබඩාව සඳහා පහත සඳහන් උපාංග පහත ප්‍රමාණයන්ගෙන් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපාංගය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 01 | බණ්ඩල් ක්ලිප්ස් | 250 |
| 02 | ටේප් රෝල් | 50 |
| 03 | 1/13 වයර් (100m) | 10 |
| 04 | පහන් ආවරණ | 50 |
| 05 | වන් ගැන් ස්විච් | 100 |
| 06 | හෝල්ඩර් | 100 |

3. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල මහජන පුස්තකාලය සතුව ඇති මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයට අදාළව ඇති තිරය රඳවා තබා ගැනීමට ආධාරකයක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

4. බිබිල ප්‍රාදේශීය සභාවේ සේවය කරන විදුලි කාර්මික නිලධාරි මහතාට රු.15,000.00 සීමාව තුළ නිල ඇඳුම් දෙකක් මිලදී ගෙන ලබාදීම

5. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල බස් නැවතුම්පලේ ස්ථාපිත කර ඇති ජල පිරිපහදුව අළුත්වැඩියා කිරීම වෙනුවෙන් OGA WATER TECHNICALS ආයතනයේ RO ජල පෙරණ යන්ත්‍ර තාක්ෂණ නිලධාරි කේ.එච්.එම්.කරුණාතිලක මහතා වෙත රු.3,600.00 ක සේවා ගාස්තුව ගෙවීමටත් KOC – 2015 විද්‍යුත් සම්පිඩනය අක්‍රීය වී ඇති බැවින් අදාළ මිල සීමාවන් තුළ එය මිලදී ගැනීම.

6. මාතර, පාලටුව, මාලිම්බඩ, නර්මදා ලිපිනයෙහි පදිංචි ටී.කේ.ලයනල් මහතා විසින් ඔහුගේ නවතම නවකථාව වන “යසා” පොතෙන් පිටපත් 02 ක්10% වට්ටම් සහිත මිල වන රු.1,260.00 කට (පොතක මිල රු.1,400.00) මිලදී ගැනීම

7. බිබිල ප්‍රාදේශීය සභාව සතු PF 7391 කැබ් රථයේ සිදුකළ යුතු පහත අළුත්වැඩියාවන් පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවෙන් අළුත්වැඩියා කිරීම
    - ඉන්ධන මීටරය ක්‍රියා නොකිරීම
    - පිටුපස ඩිකියේ SHOCKET SOBER අක්‍රීය වීම
    - WIPER BLADE SET ක්‍රියා නොකිරීම
    - A/C පද්ධතිය නිසි ලෙස ක්‍රියා නොකිරීම

8. බිබිල ප්‍රාදේශීය සභාව සතු RY 5342 ගලි බවුසරයේ පවතින දෝෂ නිවැරදි කර ගැනීම සඳහා වැල් දෙකක් එම රථයේ නියෝජිත ආයතනය වන SOLEX ආයතනයෙන් මිලදී ගැනීම

9. බිබිල ප්‍රාදේශීය සභාව සතු 252-6355 කැබ් රථයේ සිදුකළ යුතු පහත සඳහන් අළුත්වැඩියා කිරීම් පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවෙන් අළුත්වැඩියා කිරීම

    - 4x4 අක්‍රීය වීම
    - එන්ජිමෙහි ඔයිල් කාන්දු වීම
    - සංඥා පහන් අක්‍රීය වීම
    - නලාව අක්‍රීය වීම

10. බිබිල ප්‍රාදේශීය සභාව සතු මාර්ග තලන යන්ත්‍රයේ දකුණු පස දොරෙහි වීදුරුව 2023.11.14 දින අනතුරකට ලක්වී සම්පූර්ණයෙන් කුඩුවී ඇති බැවින් ප්‍රසම්පාදනය කර නව වීදුරුවක් දමා අළුත්වැඩියා කිරීම

11. බිබිල ප්‍රාදේශීය සභාව සතු පහත විස්තර සඳහන් ට්‍රැක්ටර් හා ටේලර් රථ සඳහා කාර්මික නිලධාරි නිර්දේශ ලබා දී ඇති බැවින් ටයර් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම සඳහා හා RB 4989 ට්‍රැක්ටර් රථයේ ඉදිරිපස විදුලි පහන් ප්‍රසම්පාදනය කර අළුත්වැඩියා කිරීම

    - RB 4989 ට්‍රැක්ටරය සඳහා 12.4 X 28 ප්‍රමාණයේ ටයර් 02
    - 67-1724 ටේලරයට 750X16 ප්‍රමාණයේ ටයර් 02
    - RV 8718 ටේලරය සඳහා 750X16 ප්‍රමාණයේ ටයර් 02

12. බිබිල ප්‍රාදේශීය සභාව සතු පාපැදියේ ටයර් ගෙවී ඇති බැවින් අලුත් ටයර් 02 ක් හා ටියුබ් 01 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

13. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පරණ සතිපොළෙහි අංක 12 එළවළු කඩකාමර හිමි බිබිල,අයිවෙල, මැදපිටිය, අංක 59/1 ලිපිනයෙහි පදිංචි ඩී.ආර්.විපුල්සිරි මහතා විසින් මාසික බදු ගෙවීමේ පදනම මත ලබා ගත් අංක 12 කඩකාමරය ඉවත් කරන බව දන්වා ඇති බැවින් එම කඩකාමරය ඉවත් කරන්නේ නම් ඒ වෙනුවට නව වෙළඳපොල වෙතින් වෙළඳාම් කටයුතු කිරීම සහා බදු ගෙවීමේ පදනම මත නව කඩකාමරයක් ලබා දෙන ලෙස ඉල්ලීමේ ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, සභාව සතුව පවතින කඩකාමර තක්සේරු කිරීමේදී එම තක්සේරු වටිනාකම අනුව කඩකාමරයක් ලබා දීම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).02. ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා**

**(ඉ).02.01. බිබිල මහජන පුස්තකාල උපදේශක කමිටුවට නව සාමාජිකයෙක් පත්කර ගැනීම.**

පුස්තකාල ව්‍යාප්ති සේවා සිදු කර ගැනීමේදී විශේෂ සම්පත් දායකත්වයක් සපයනු ලබන ඒ.එම්. තිලෝචන ප්‍රසාද් මහතා 2026 වර්ෂයේ බිබිල මහජන පුස්තකාලයේ උපදේශක කමිටුවට ඇතුළත් කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ). කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

- 2025.03.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

## (උ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2026 පෙබරවාරි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 9,705,216.79 |
| මූලධන ලැබීම් | - රු. 853,227.27 |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. 10,558,444.06 |
| වෙනත් ලැබිම් | - රු. 1,387,482.59 |
| මුළු ලැබීම් | - රු.22,504,370.71 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,589,042.52 |
| ප්‍රාග්ධන වියදම් | - රු. - |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 10,713,982.29 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු. 19,303,024.81 |

**2026.02.28 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 24,181,393.22 |
| අක්කර බදු | - රු. 11,840.58 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 1,298,513.50 |
| ජල ගාස්තු රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 179,259.00 |
| කුලී මුදල් | - රු. 1,748,009.34 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 3,120,382.09 |
| එකතුව | - රු. 30,539,397.73 |

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

2026 01.01 දිනට බිබිල සතිපොළේ හා පිටකුඹුර සතිපොළේ හිඟ මුදලක් පවතින බව පැවසීය. මීට පෙර වර්ෂයේ සතිපොළ ටෙන්ඩර් කර බදු ලබා දී ඇති බවත් මෙම මුදල් අය කර ගැනීම පිළිබඳව විමසා සිටින ලදී.

**ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා**

මෙම මුදල පොළ බදු ලබාගෙන සිට බදුකරුවන් විසින් ගෙවීමට ඇති හිඟ මුදලක් බවත් එම මුදල සතිපොළ බදු ලබාගෙන සිටි බදුකරුවන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරන බව පැවසීය.

## (ඌ).වෙනත් කරුණු

**(ඌ). 01. ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමාගේ නිවාඩු දැනුම්දීම.**

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා අසනීප බැවින් මෙදින මාසික සභා රැස්වීම සඳහා සහභාගි නොවන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසී ය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය**

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්ට ලැබෙන වරප්‍රසාදයක් වන සාමදාන විනිශ්චකාර තනතුර මේ වන තෙක් ලබා දී නොමැති බවත් මෙය සභා වාර කිහිපයකදී ගරු සභාපතිතුමා දැනුවත් කළද එය ලබාදීමට කටයුතු කර නොමැති බවත් ජනතාව සමග නිරන්තරයෙන් කටයුතු කරන බැවින් එම අවශ්‍යතාවය සඳහා තමා වෙත පැමිණෙන ජනතාවට තමාට මේ වන තෙක් සාමදාන විනිශ්වයකාර තනතුර ලැබී නැති

බව පැවසූ විට මනත්‍රී වරයෙක් ලෙස තමා හැල්ලුවට ලක්වන බවත් එබැවින් හැකි ඉක්මණින් මෙම වරප්‍රසාදය ලබාදීමට කටයුතු කරන ලෙසත් මෙම වරප්‍රසාදය සභාවෙන් ඉල්ලා සිටින අවසන් වතාව බවත් පැවසීය.

ප.ව.12.30ට ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා**</u>

මේ වනවිට රටේ ඇති වී ඇති ඉන්ධන අර්බුධය හමුවේ ගොවි ජනතාව අසීරු තත්වයට ලක් වී ඇති බවත් කෝටා ක්‍රමයට ඉන්ධන ලබාදීම නිසා ගොයම් කපන යන්ත්‍ර සඳහා ලැබෙන ඉන්ධන ප්‍රමාණය දින දෙකකට පමණ ප්‍රමාණවත් වන බැවින් ගොවි ජනතාවට ඉන්ධන ලබා දෙන ලෙස යන්ත්‍රකරු විසින් ඉල්ලා සිටින බවත් ගොවියන් හට ඉන්ධන ලබා නොදෙන නිසා ඒ අය අසීරුතාවයට පත්වන බව පැවසීය. එබැවින් මෙම බිබිල ප්‍රදේශයේ ජනතාවට රාත්‍රී කාලයේදී හෝ ගොයම් කැපීමට කෑන් වලට ඉන්ධන කිසියම් ප්‍රමාණයක් ලබාදීමට ක්‍රමයක් සකස් කිරීමට මැදිහත් වන ලෙසත් සභාව පැවැත්වෙන දිනයන්හි මන්ත්‍රී මණ්ඩලයට තේ පැන් සංග්‍රහයක් නොලැබෙන බැවින් පෙ.ව. 11.00ට වත් තේ බීමට පැය ½ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>**ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා**</u>

වර්ෂා කාලයේදී පාරවල් සේදී ගොස් ගමන් කිරීමට නොහැකි තත්වයටම අබලන් වී ඇති බැවින් පිටකුඹුර කොට්ඨාසයේ මාර්ග මොටර් ග්‍රේඩර් කරන ලෙස ඉල්ලා සිටින ලදී. මීට පෙර පාලන සමයෙහි පිටකුඹුර වසමෙන් පත්වී සිටි ඔබේසේන මනත්‍රීතුමා වසරකට වරක් හෝ දෙවරක් මෝටර් ග්‍රේඩර් කළ බව පැවසූ අතර මේ වනවිට වර්ෂාව නතර වී ඇති බැවින් කඩිනමින් අවුරුදු සමය එළඹීමට පෙර මාර්ග මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**</u>

බිබිල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වල නියුතු වන ජනතාවක් වෙසෙන බවත් රජයේ නීතියට අනුව වාහනවලට ඉන්ධන කොටා ක්‍රමයට ලබා දෙන නිසා එම යන්ත්‍ර සඳහා සතියකට ලැබෙන ඉන්ධන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් හා ගොවි ජනතාවට ඉන්ධන කෑන් වලට නොදෙන බැවින් ජනතාව අසීරුතාවයට පත්වී ඇත. එබැවින් මෙම ප්‍රදේශයේ වගකිව යුතු නිළධාරීන් සමග එක්ව ගොවි ජනතාවට ඉන්ධන ලබාදීමට ක්‍රමයක් සකස් කිරීමට සුදුසු බව පැවසීය.

මීන් පෙර පාලන සමයන්හි සභාව රැස්වන දිනයන්හි ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලයට පමණක් නොව සභාවේ සියලුම කාර්ය මණ්ඩලයට තේ පැන් සංග්‍රහයක් ලබාදුන් බවත් ඒ සඳහා රු.20,000.00 ක පමණ මුදලක් වැය වන්නට ඇතැයිද පැවසීය. මෙය සභාවක සම්ප්‍රදායක් බවත් මෙම සංග්‍රහ වියදම අනවශ්‍ය වියදමක් ලෙස සලකා කපා හැරීම නුසුදුසු බවත් පැවසීය. කිසිම යෝජනාවකට අදහස් නොදක්වා වාඩිවී සිට යන්නේ නම් සභා රැස්වීම පෙ.ව.11.00ට පමණ අවසන් කිරීමට හැකි බවත් එසේ නම් තේ පැන් සංග්‍රහයක් ලබා දීමට අවශ්‍ය නොවන බව පැවසීය. ජනතාව විසින් ප්‍රාදේශීය සභාවට මන්ත්‍රී මණ්ඩලය පත් කර එවා ඇත්තේ වාඩි වී සිට ජනතාව වෙනුවෙන් අදහස් නොදක්වා යාමට නොව ජනතා සේවයක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් බව පැවසීය. පක්ෂයේ මන්ත්‍රී මණ්ඩලයෙන් කිසිදු බලපෑමක් නොමැති බවත් එසේ යැයි පවසා සභාවේ වාඩිවී සිට දීමනාව රැගෙන යාමට තමාට හැකියාව තිබුණද යෝජනාවන් සඳහා අදහස් දක්වනු ලබන්නේ ප්‍රාදේශීය සභාව හා ජනතාව වෙනුවෙන් බව පැවසීය.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන නිවැරදි යෝජනාවන් සඳහා විපක්ෂයේ සියළු දෙනා සහයෝගය ලබා දෙන බවත් ප්‍රයෝජනයක් නොමැති යෝජනා සඳහා විරෝදතාවය දක්වන බව පැවසීය. විපක්ෂයේ මන්ත්‍රීවරුන් යෝජනා සඳහා අදහස් දැක්වීමේදී කණ්ඩායමක් ලෙස සාකච්ඡා කර

අදහස් නොදක්වන බවත් , තමාගේ ස්වාධීන අදහස ඉදිරිපත් කරන බවත් ,ඡන්දයක් පවත්වන අවස්ථාවේ දී එකිනෙකාට බලපෑමක් නොකරන බවත්, තමාගේ ඡන්දය ස්වාධිනව ලබා දෙන බවත් විනිවිදභාවයකින් යුක්තව කටයුතු කරන බව පැවසීය. එසේම ජාතික ජන බලවේග මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගෙන්ද විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කරන ලෙස පවසන ලදී.

පක්ෂයේ මතය පමණක් දිනවීම සඳහා තමාගේ සිතට අවංක නොවී සභාවට ඉදිරිපත් කරන සියලුම යෝජනාවලට පක්ෂව ඡන්දය දීමට ජාතික ජන බලවේග මන්ත්‍රීවරු කටයුතු කළද මීට පෙර පැවති පාලන සමයන්හි එසේ නොව නිවැරදි තීරණය සඳහා පක්ෂ හා විපක්ෂ සියළු දෙනා එක් වන බව පැවසීය. විපක්ෂ මන්ත්‍රීවරු යෝජනාවන් සඳහා ඡන්ද විමසීමක් සිදු කිරීමේදී විරුද්ධව ඡන්දය ලබා දෙනු ලබන්නේ විරෝදතාවය දැක්වීමට පමණක් බවත් එම ඡන්දයෙන් පරාදවන බව දැන දැනම බව පැවසීය. ඉදිරියේදී සභාව මගින් ඉටුකළ හැකි සංවර්ධනයක් ජනතාව වෙනුවෙන් පක්ෂ විපක්ෂ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා එක්ව ඉටු කිරීමට කටයුතු කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

ප්‍රදේශයේ ගොවි ජනතාව සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ කෘෂි පර්යේෂණ නිළධාරිතුමා වෙත තොරතුරු ලබාදෙන ලෙසත් ඉදිරි සති දෙක තුළ ලබාදීමට බලාපොරොත්තු වන බව දන්වා ඇති බව පැවසූ අතර බිබිල බදුල්ල මාර්ගයේ යල්කුඹුර ප්‍රදේශයේ මාර්ග පුළුල් කිරීමේදී පොදු ජල කරාම 03ක් ඉවත් කිරීම පිළිබඳව ගම්වාසීන් ලිපියක් ලබා දුන්නාදැයි ගරු සභාපතිතුමාගෙන් විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනුදැනුම ඇතිව වසම භාර සංවර්ධන නිළධාරි විසින් ගොවි ජනතාව සඳහා අවශ්‍ය වන ඉන්ධන ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු රැස්කළ බවත් ඉදිරි සතිය තුළ ලබා දීමට තීරණයක් පවතින බවත් ඒ සඳහා ගරු සභාපතිතුමා ද මැදිහත් වන ලෙසත් ඉල්ලා සිටියේය. නිල්ගල කොට්ඨාසයේ මාර්ග වැසි සමයේ සේදී ගොස් අබලන් වී ඇති බැවින් මෙම තෙල් අර්බුධය විසඳා ගැනීමේ ක්‍රමවේදයක් සකස් විමෙන් පසුව එම මාර්ග මෝටර් ග්‍රේඩර් කර පිළිසකර කර දෙන ඉල්ලා සිටින ලදී. ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පක්ෂයේ මන්ත්‍රීවරුන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු නොව වෙනත් පක්ෂවල මන්ත්‍රීවරු බව පැවසුවද තමා මේ වනවිට හදවතින් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් බවත් තමන් පෙර වෙනත් පාක්ෂිකයෙකු වුවද තමන් කැමති නිවැරදි දැක්මක් සහිත පක්ෂයක එහි ක්‍රමවේදයට අනුගත වී එම පක්ෂයේ සාමාජිකයෙකු ලෙස හදවතින් බැදී කටයුතු කරන බවත් එබැවින් මෙම පක්ෂ මන්ත්‍රීවරුන් සියළු දෙනා ජාතික ජන බලවේගයේ නොවන බව පැවසීම වැරදි බවත් මන්ත්‍රීවරු එය නොපිළිගන්නා බවත් පැවසීය. දිට්වා සුළි කුණාටුව, ඉරාන ඊශ්‍රායල ගැටුම වැනි තත්වයන් නිසා රටෙහි සංවර්ධන කටයුතු ඉටු කිරීමට බලපෑමක් සිදුව ඇති බවත් මෙම ගරු සභාවට තමා පත්වී පැමිණියේ ගසා කෑමට නොව ගෞරවයෙන් ජනතාවට සේවයක් කිරීමට පැවසීය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා</u>

දරුවාගේ ශිෂ්‍ය නායක බැජ් පැලදවීමේ උත්සවයට සහභාගි වීම නිසා සභා රැස්වීම සඳහා සහභාගිවීමට ප්‍රමාද වූ බවත් මේ පිළිබඳව ගරු සභාපතිතුමා දැනුවත් කළ බව පැවසීය. දේශපාලනමය වශයෙන් කිසිවෙකු සමග තරහක් නොමැති බවත් ප්‍රාදේශීය සභාව සඳහා තමාගේ අවශ්‍යතාවයට නොව ජනතාවගේ අවශ්‍යතාවයට පත්කර එවා ඇති බවත් තම පක්ෂය , පක්ෂයේ ප්‍රතිරූපය හා තමා පෞද්ගලිකව ගොඩනගා ගෙන ඇති ප්‍රතිරූපය අනුව තමාට ඡන්දය ලබාදී ප්‍රාදේශීය සභාව සඳහා පත් කර එවා ඇති බව පැවසීය. තමා බිබිල මහාමාත්‍ය විද්‍යාලය, පිටකුඹුර ද්විතීයික පාසල , පිටකුඹුර ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල පාසල් සංවර්ධන සමිතිවල ලේකම් ධූරය ලබා ඇති බවත් එපමණක් නොව සමාජයේ විවිධ සංවිධානවල තනතුරු ලබමින් සමාජයට සේවාවක් කරමින් තම ප්‍රතිරූපය ගොඩනගා ගෙන ඇති බව පැවසීය.

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්ට හිමිවිය යුතු වරප්‍රසාදයක් වන සාමදාන විනිශ්චයකාර තනතුර මේ වන තෙක් මන්ත්‍රී මණ්ඩලයට නොලැබී ඇති බවත් එම නිසා මෙම තනතුරින් සමාජයට ඉටුකළ යුතු වගකීම් ඉටු කිරීමට නොහැකි වී ඇති බවත් පැවසීය. තමා වෙත සාමදාන විනිශ්චයකරුවෙකුගේ සහතිකයක් ලබා ගැනීමට පැමිණි පුද්ගලයෙකුට එම වගකීම ඉටුකර දීමට නොහැකි වූ බවත් තමා එම අවස්ථාවේ අසරණ වූ බවත් එබැවින් ගරු සභාපතිතුමා මැදිහත් වී මෙම තනතුරු ලබාදීමට අවශ්‍ය කටයුතු සලසාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.

සම්ප්‍රදායිකව එකම දේශපාලන පක්ෂයක නොසිට වෙනස් වියයුතු තැන් වලදී වෙනස් වී රටට සේවයක් , වැඩක් කළහැකි පක්ෂයකට සහයෝගය ලබාදීමට තමා බැඳී සිටින බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය.</u>

රතුපස්කැටිය ප්‍රදේශයේ ගලා එන ජලය ක්‍රමානුකූලව කවුඩැල්ල කුඹුරු යායට ලබා ගෙන කන්න දෙකම වැඩ කළහැකි ආකාරයට ජලය ගබඩා කර තබා ගතහැකි ක්‍රමයක් සකස් කර දෙන ලෙස ගම් වාසීන් ඉල්ලුම් කරන බැවින් ඒ සඳහා සුදුසු ක්‍රමයක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටි අතර ඊශ්‍රායල ඉරාන යුද්ධ කොතරම් සිදුවුවද ගොවිතැන වැඩි දියුණු කර ගතහොත් ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි බවත් එබැවින් ජලය ගබඩා කර ගැනීමට හැකි ක්‍රමයක් සකස් කිරීම සුදුසු බවත් හිටපු ප්‍රාදේශීය සභා සභාපති ගුණසේකර මැතිතුමා විසින් ඉදිකර ඇති නළ ළිඳක් පවතින බවත් ජනතාවට ප්‍රයෝජනයට ලබා ගතහැකි ආකාරයට එය පිරිසිදු කිරීම සුදුසු බව පැවසීය.

<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>

ගරු මන්ත්‍රී වසන්තී ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් කරගහවෙල නැගෙනහිර හා බටහිර වසම්වල අක්‍රීය වී ඇති වීථි ලාම්පු සඳහා නව බල්බ යෙදීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර තමා වෙත ලිපියක් භාර දුන් බවත් එම බල්බ සවි කිරීම සඳහා විදුලි කාර්මික මහතා වෙත පැවරූ බවත් පැවසීය.

යල්කුඹුර ප්‍රදේශයේ මාර්ග පුළුල් කිරීමේදී හා නායකඳුර ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේදී පොදු ජල කරාම 03ක් ඉවත කර ඇති බවත් ඒවා නැවත ස්ථාපිත කර දෙන ලෙස ජනතාව විසින් ඉල්ලීමක් කර ඇති බව පැවසූ අතර මීට පෙර සභාවට පත්ව සිටි සභාපතිතුමා මෙම ජල කරාම වලින් ජලය අපතේ යන බැවින් නැවත ස්ථාපිත නොකර ඇති බවත් මේ පිළිබඳව පරිපාලනයෙන් විමසුමක් කළයුතු බවත් ඉන් පසුව මේ පිළිබඳව සභාවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය.

මන්ත්‍රී මණ්ඩලය සඳහා සාමදාන විනිශ්චයකාර තනතුර ලබාදීමට අදාළ ගැසට් නිවේදනයක් ඉක්මණින් ලබා ගැනීමට උත්සාහ කරමු යැයිද ඒ සඳහා මැදිහත් වන බවත් පැවසීය.

ජාතික ජන බලවේගය ලෙස ආණ්ඩු ක්‍රියාවලියත් ,පළාත් සභා ක්‍රියාවලියත් , පළාත් පාලන ක්‍රියාවලියත් අසාර්ථක තත්වයට පත්වී නොමැති බවත් එළඹෙන ඕනෑම අභියෝගයක් දරා ගනිමින් ඒවාට මුහුණ දෙමින් එම අභියෝග ජය ගැනීමට කටයුතු කරමින් මෙම පක්ෂය බලාපොරොත්තු වූ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ළඟාකර දීම සඳහා මූලිකව පියවරෙන් පියවර ඉදිරියට යමින් රාජ්‍ය ක්‍රියාවලිය මෙහෙයවමින් ස්වභාවිකව හා ජාත්‍යන්තර වශයෙන් උද්ගත වන මෙම අර්බුධයන් මුහුණ දෙමින් රට පාලනය කරමින් සිටින බව පැවසීය.

බ්‍රිතාන්‍ය රාජ්‍යයන් පවා මෙම රට පාලනය කර සංචිත සම්පත් සහිතව රට භාරදී ගියද ජාතික ජනබල වේගය ආණ්ඩුවට බංකොලොත්වූ සීමිත සම්පත් සහිත රටක් භාරදුන් බවත් තමාගේ පක්ෂය අසාර්ථක රාජ්‍ය පාලනයක් ගෙන නොයන බවත් ඉදිරියේදී රටෙහි සංවර්ධනය සියළු දෙනාට බලාගත හැකි බවත් පැවසීය. ආණ්ඩුව වෙනස් කිරීමට තව අවුරුදු හතරක් පවතින බවත් පළාත් පාලන ආයතන වෙනස් කිරීමට තව අවුරුදු තුනක් හා මාස හයක් පවතින බවත් ඉදිරියේදී පළාත් සභා මැතිවරණයක්

පැවැත්වීමට නියමිත බවත් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට මුදල් වෙන් කර ඇති බවත් පෙර ආණ්ඩු මෙන් ඡනදත් නැති සල්ලිත් නැති ආණ්ඩුවක් නොවන බවත් ඡන්ද සඳහා මුහුණදීමට බිය ආණ්ඩුවක් නොවන බවත් පැවසීය. දැනට තෙල් පෝලිම් ඇති වී ඇත්තේ ජාත්‍යන්තර අර්බුධයක් වන යුද්ධමය තත්වය නිසා බවත් , රටේ මුදල් නොමැතිව අසාර්ථක වූ ආණ්ඩුවක් නිසා නොවන බව පැවසීය. ජාත්‍යන්තර සියළු රටවල් සමග සබඳතා පවත්වමින් ලැබුණු කාල පරිච්ඡේදය තුළ සාධනීය වෙනස්කම් කර ඇති බවත් ඉදිරියේදී ඊට වඩා වෙනස්කම් කරමින් රට පවත්වාගෙන යන බවත් පැවසීය.

පළාත් පාලන ආයතනයක් ලෙස බිබිල ප්‍රාදේශීය සභාවද සභා රැස්වීම සඳහා පවා තේ පැන් සංග්‍රහය ලබා නොදෙමින් ඉන්ධන වියදම් අඩු කර ගනිමින් ඉතිරි කර ගත් අරමුදලින් හා එවැනිම ඉතිරි කරගනු ලැබූ අරමුදල් වලින් දිට්වා සුළි කුණාටුවෙන් අසරණ තත්වයට පත්වූ ජනතාවට සහන ලබා දුන් බව පැවසීය.

රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් තිබුණද කැමති ආකාරයෙන් වියදම් කිරීමට නොහැකිව ඇත්තේ IMF ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුව ඇති බැවින් බවත් එම ගිවිසුමෙන් ඉවත් වුවහොත් රටක් ලෙස විශාල මුදලක් ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමට සිදුවන බවත් පැවසීය. කෙසේ වුවද ඒවාට අනුගත වෙමින් රට සාධනීය තත්වයට මේ වනවිට පත්කර ඇති බව පැවසීය. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ලෙස සියළු දෙනාටම ස්වාධීනව නිදහස් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී ඇති බවත් ස්වාධීනව තීන්දු තීරණ ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇති බවත් ජාතික ජනබලවේගයේ තීන්දු තීරණ ගැනීමේදී නිවැරදිව ප්‍රවේශවී නිවැරදි තීරණ ගනු ලබන බවත් එමගින් සාධනීය තත්වයට පත්ව ඇති බවත් තමා පෞද්ගලිකව විශ්වාස කරන බව පැවසීය. එසේම රාජ්‍ය නිළධාරීන්ට ද ඔවුන්ගේ රාජකාරි කටයුතු සිදු කිරීමේදී දේශපාලන මැදිහත් වීමක් බලපෑමක් නොකරන බවත් බිබිල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලයද එසේම බවද පැවසීය.

මේ වනවිට බිබිල ප්‍රාදේශීය සභාවෙහිද අරමුදලක් ඉතිරි කරගෙන සිටින බවත් එම මුදලින් සහා බල ප්‍රදේශයේ මාර්ග කැපීම ආරම්භ කළ බවත් සිංහල හින්දු අලුත් අවුරුද්දට පෙර සියළු මාර්ග කැපීමට නොහැකි වුවත් සැලකිය යුතු ප්‍රමාණයක් කැපීමට කටයුතු කරන බව පැවසීය. මෙම කටයුතු සිදු කිරීමේ දී ඉන්ධන ලබා ගැනීම පිළිබඳව ගැටලු වලට මුහුණ පෑමට සිදුවන බවත් පෙන්වා දෙන ලදී.

ඉදිරියේදී සිංහල හින්දු අලුත් අවුරුද්ද එළඹෙන බැවින් ජනතාවගේ අවශ්‍යතාවයන්, බලාපොරොත්තු , අභිප්‍රායන් ඉටුවන ආකාරයට කටයුතු කිරීමට සියළු මන්ත්‍රී මණ්ඩලය එකතු වී කටයුතු කරමු යැයි හා සියලු දෙනාට සුභ අලුත් අවුරුද්දකට ආසිරි පතමින් ගරු මූලාසනය විසින් 2026 මාර්තු මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2026 අප්‍රේල් මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත අප්‍රේල් 21 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව මාර්තු මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල - කා.දැ.ගැ.පි

**සංශෝධන -**

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

16 පිටුවේ ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීමේදී **සනාථ කගෙන** ලෙස මුද්‍රණය වී ඇති බැවින් එය **සනාථ කරගෙන** ලෙස සංශෝධනය විය යුතු බවත් 17 පිටුවෙහි ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමියගේ අදහස් දැක්වීමේදී **පුද්ගලකු** ලෙස මුද්‍රණය වී ඇති බැවින් එය **පුද්ගලයෙකු** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>**

19 වැනි පිටුවෙහි ගරු එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීමේදී **අඩි 03ක් පිටුපසට ගෙන ඉදි කරන ලෙස එවකට ප්‍රාදේශීය සභාවේ සභාපති ,සභා ලේකම්, කේ.ලීබට් මහතා කොන්ත්‍රාත්කරු , මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු යන අය** ලෙස සටහන්ව තිබීම **අඩි 03ක් පිටුපසට ගෙන ඉදි කරන ලෙස එවකට ප්‍රාදේශීය සභාවේ සභාපති ,ප්‍රාදේශීය ලේකම්, කේ.ර්බට් මහතා කොන්ත්‍රාත්කරු , මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු යන අය** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

පිටු අංක 16 හි **ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නාමල් බණ්ඩාර** මැතිතුමා ලෙස මුද්‍රණය වී තිබීම **නිමල්** ලෙස සංශෝධනය විය යුතු බව පැවසීය.